වාර්ෂික වාර්තාව
2011

ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

තලපත්පිටිය, නුගේගොඩ

ශ්‍රී ලංකාව

දොරටුවේ ඵලකය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ

සහ

ජපානය අතර පවත්නා

මිත්‍රත්වයේ සහ සහයෝගීතාවයේ සංකේතයක් වශයෙන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ජනාධිපති ජූනියස් රිචඩ් ජයවර්ධන උතුමාණන්ගේ

අභිප්‍රාය අනුව

ජපන් රජය විසින්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රක සමාජවාදී ජනරජය

වෙත

පරිත්‍යාග කරන ලද

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල

සහ

පශ්චාත් උපාධි පුහුණු මධ්‍යස්ථානය

1983

අපගේ මෙහෙවර

කැපවීමකින් හා උනන්දුවකින් යුතු කාර්ය මණ්ඩලයක
අනුග්‍රහයෙන් දේශිය හා ජාත්‍යන්තර ප්‍රජාවට
සේවාවක් සපයන්නාවූද, පූර්ව හා පශ්චාත් උපාධි සහ
පර්යේෂණ අධ්‍යයන පහසුකම්වලින් යුක්තවූද,
උසස් ආචාර ධර්මයන්ගෙන් හා ප්‍රමිතීන්ගෙන් යුත්
ගුණාත්මකව රෝගී සත්කාරක සේවාවක් සපයන්නාවූද,
බහු ශික්ෂණ, ගාස්තු අය කරන රෝහලක් සහ
තෘතීක යොමු මධ්‍යස්ථානයක් බවට පත්වීමයි.

අපගේ දැක්ම

ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාව සඳහා
උසස් වෛද්‍ය සේවා
සපයනු ලබන
උත්කෘෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්විමයි.

පටුන ***අංකය***

පටුන	අංකය
ඓතිහාසිකමය කරුණු	01
සංස්ථාමය තොරතුරු	02
විශේෂඥ කාර්ය මණ්ඩලය	03-04
සභාපතිතුමාගේ පණිවිඩය	05
අධ්‍යක්‍ෂතුමාගේ වාර්තාව	06
මෙහෙයුම් පිළිබඳ බණ්ඩමය සමාලෝචනය	07-30
සංස්ථාමය පාලනය	31-32
ශේෂ පත්‍රය	33
ආදායම් වාර්තාව	34
මුදල් ප්‍රවාහ වාර්තාව	35
ගිණුම්වලට අදාල සටහන්	36-42
වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති	43-47
විගණකාධිපතිතුමාගේ වාර්තාව	48-64
දස වසරක සාරාංශය	65

ඓතිහාසික තොරතුරු

එවකට ශ්‍රී ලංකාවේ ජනාධිපති ධුරන්දර අතිගරු ජේ. ආර් ජයවර්ධන උතුමාණන් සහ ජපන් රජය නියෝජනය කරමින් ගරු ඉෂිමායිෂු කිටාගාවා මැතිතුමා විසින් 1984 සැප්තැම්බර් 17 වන දින ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

ප්‍රථම අධ්‍යකෂ මණ්ඩලය වනිතා කටයුතු සහ ශික්ෂණ රෝහල් ඇමතිනි ගරු සුනේත්‍රා රණසිංහ මැතිණිය විසින් 1985 පෙබරවාරි 23 වන දින පත්කරනු ලදී. ඒ සඳහා වෛද්‍ය ආර්. බී. ජේ පීරිස් මහතා (සභාපති) වෛද්‍ය ඩී. ඩී සමරසිංහ මහතා (අමාත්‍යාංශ නියෝජිත), එස්. පී චන්ද්‍රදාස මහතා (මුදල් අමාත්‍යාංශ නියෝජිත), කේ. එන්. චොක්සි මහතා (ජනාධිපති නීතිඥ) එම්. ටී ප්‍රනාන්දු මහතා (වරලත් ගණකාධිකාරි), වෛද්‍ය මාලිංග ප්‍රනාන්දු මහතා (සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජනරාල්), වෛද්‍ය එස්. බී කබ්රාල් මහතා (පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යක්‍ෂ) සහ මණ්ඩලයේ ලේකම් වශයෙන් කේ. ඩී. එල්. රත්නසේන මහතාද අයත්වුහ. පළමු අධ්‍යකෂක මණ්ඩල රැස්වීම 1985 පෙබරවාරි මස 28 වන දින පවත්වන ලදී. වෛද්‍ය එච්. එච්. ආර් සමරසිංහ (M.D, F.R.C.P.) මහතාගේ භාරයේ 1984 දෙසැම්බර් 17 වන දින ප්‍රථම රෝගියා රෝහල් වාට්ටුවට ඇතුලත් කරන ලදී.

1985 ජනවාරි 17 දින වෛද්‍ය කේ. යෝගේස්වරන් F.R.C.S මහතා විසින් වෛද්‍ය කේ. ඒ. පෙරේරා (FRARCS) මහතාගේ නිර්වින්දය මත ප්‍රථම ශල්‍යකර්මය සිදු කරන ලදී.

1985 ජනවාරි 18 වන දින වෛද්‍ය කිංස්ලි ද සිල්වා (FRCOG, FRCSE) මහතාගේ භාරය යටතේ ප්‍රථම දරු ප්‍රසූතිය සිදුවිය. රෝග සුව කරන්නාවු සෞඛ්‍ය සේවාවක් සඳහා අතිරික්තයක් සැපයීමේ සහ වෛද්‍ය උපාධි හා පශ්චාත් උපාධි අපේක්‍ෂයින් මෙන්ම අනෙකුත් වෛද්‍ය කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ආයතනයක් වශයෙන්ද ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල පිහිටුවන ලදී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන අතර, රෝහලේ එදිනෙදා කළමනාකරණය සඳහා ක්‍රියාකාරි පාලනය කළමනාකරණ කමිටුවක් වෙත පැවරී ඇත. රෝහල පවත්වාගෙන යාම සහ ප්‍රාග්ධන උපකරණ සඳහා අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරයෙන් හා රෝහලේ ඉපයීම්වලින් සපුරා ගැනීම සිදු කෙරේ.

සංස්ථාමය තොරතුරු

සංවිධානයේ නම	- ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල
ලිපිනය	- තලපත්පිටිය, නුගේගොඩ, ශ්‍රී ලංකාව
නීතිමය ස්වරූපය	- 1983 අංක 54 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

එන්. ඩබ්ලිව්. ඊ විජේවන්ත මහතා	- සභාපති (2011.01.21 - 2011.10.05)
එම්. එම්. එන්. ඩී. බණ්ඩාර මහතා	- සභාපති (2011.10.12 සිට)
වෛද්‍ය ඩී. එල්. ද ලැනරෝල් මහතා	- රෝහල් අධ්‍යක්ෂ (නිලබලයෙන් 2011.01.21 දක්වා)
වෛද්‍ය එස්. ඒ. කේ ගමගේ මහතා	- රෝහල් අධ්‍යක්ෂ (නිලබලයෙන් 2011.02.18)
වෛද්‍ය අජිත් මෙන්ඩිස් මහතා	- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (නිලබලයෙන්)
මහාචාර්ය රිස්වි ෂෙරිෆ් මහතා	- අධ්‍යක්ෂ - පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය (නිලබලයෙන්)
හිරන්සා කළුතන්ත්‍රි මහත්මිය	- මහා භාණ්ඩාගාර නියෝජිත (2011.04.11 - 2011.11.29)
මහාචාර්ය ජානක ද සිල්වා මහතා	- අමාත්‍යංශ නියෝජිත (2011.10.17 සිට)
වෛද්‍ය පී. ජී මහිපාල මහතා	- අමාත්‍යංශ නියෝජිත (2011.11.16 සිට)
වෛද්‍ය ඩී. ජේ වික්‍රමරත්න මහතා	- විශේෂඥ වෛද්‍ය නියෝජිත (2011.11.16 සිට)
වෛද්‍ය ඩී. එල්. පියරිස් මහතා	- විශේෂඥ වෛද්‍ය නියෝජිත (2011.11.16 සිට)
වෛද්‍ය එම්. වීරසේකර මහත්මිය	- විශේෂඥ වෛද්‍ය නියෝජිත (2011.11.16 සිට)
වෛද්‍ය හර්ෂ සමරවීර මහතා	- අමාත්‍යංශ නියෝජිත
කිරාන් අතපත්තු මහතා	- අමාත්‍යංශ නියෝජිත (2011.01.21 - 2011.10.05)
මහින්ද සමරසේකර මහතා	- අමාත්‍යංශ නියෝජිත (2011.01.21 - 2011.10.05)
තිලානි රාජපක්ෂ මහත්මිය	- මණ්ඩලයේ ලේකම්

බැංකුකරුවන්

ලංකා බැංකුව
හැටන් නැෂනල් බැංකුව
ස්ටෑන්ඩ් චාර්ටඩ් ග්‍රින්ඩ්ලේස් බැංකුව

කළමනාකරණ කමිටුව

1. වෛද්‍ය එස්. ඒ. කේ ගමගේ මහතා	- අධ්‍යක්ෂ - කමිටුවේ සභාපති
2. වෛද්‍ය සී. ආරියනන්ද මහත්මිය	- සහකාර අධ්‍යක්ෂ - සාමාජික
3. වෛද්‍ය රොහාන් ඇලෝසියස් මහතා	- ළමා රෝග විශේෂඥ - සාමාජික
4. වෛද්‍ය පී. ජේ අඹවත්ත මහතා	- ව්‍යාධිවේදී විශේෂඥ - සාමාජික
5. වෛද්‍ය හර්ෂ ගුණසේකර මහතා	- ස්නායු වෛද්‍ය විශේෂඥ - සාමාජික
6. ඩී. ඒ පෙරේරා මහතා	- සහකාර ගණකාධිකාරි - සාමාජික (ආරාධිත)
7. ටී. රාජපක්ෂ මහත්මිය	- රෝහල් ලේකම් - සාමාජික
8. ඒ. එන්. සපුතන්ත්‍රි මහත්මිය	- ප්‍රධාන හෙද පාලිකා - සාමාජික

විගණන කමිටුව

හිරන්සා කළුතන්ත්‍රි මහත්මිය - රෝහල් මණ්ඩලයේ සාමාජික - සභාපති
හර්ෂ සමරවීර මහතා - රෝහල් මණ්ඩලයේ සාමාජික - සාමාජික
මහින්ද සමරසේකර මහතා - රෝහල් මණ්ඩලයේ සාමාජික - සාමාජික
එච්. ඩී. එල්. සී. කරුණාරත්න මහතා - අභ්‍යන්තර විගණන නිළධාරි - කැඳවුම්කරු

විශේෂඥ කාර්ය මණ්ඩලය

නිර්වින්දන විශේෂඥ
- වෛද්‍ය සී. එන්. කරුණාරත්න මිය
  (එම්.බී.බී.එස්, එම්.ඩී (ලංකා) එෆ්.ආර්.සී.ඒ (ලන්ඩන්))
- වෛද්‍ය වී. කේ. පී ඉන්ද්‍රරත්න මහතා
  (එම්.බී.බී.එස්, එම්.ඩී, එෆ්.ඒ.ආර්.සී.එස්.අයි.එෆ්.ආර්.සී.ඒ)
- වෛද්‍ය ජේ. එස්. කේ. රාජසිංහ මිය
  (එම්.බී.බී.එස්., එම්.ඩී., එෆ්.ආර්.සී.ඒ. (එක්සත් රාජධානිය)
- වෛද්‍ය ආර්. පී. එස්. පලිහවඩන මිය
  (එම්.බී.බී.එස්., එම්.ඩී., එෆ්.ආර්.සී.ඒ. (එක්සත් රාජධානිය)

හෘද රෝග විශේෂඥ
- වෛද්‍ය එන්. එල්. අමරසේන මිය
  (එම්.බී.බී.එස්., එම්.ඩී. (කොළඹ), එෆ්.ආර්.සී.ඒ. (ලන්ඩන්))
- වෛද්‍ය ජේ. පී. හේරත් මහතා
  (එම්.බී.බී.එස්., එම්.ඩී.))

හෘද උරස් ශල්‍ය විශේෂඥ
- වෛද්‍ය පී. ඒ ගුණරත්න මහතා
  (එම්.බී.බී.එස්., එම්.එස්., එෆ්.ආර්.සී.ඒ))
- වෛද්‍ය ඒ. ඩී. කපුරුගේ මහතා
  (එම්.බී.බී.එස්., එම්.එස්.,))

උගුර කණ නාසය ශල්‍ය විශේෂඥ
- වෛද්‍ය ඒ. ජයසේන මහතා
  (එම්.බී.බී.එස්., එම්.එස්., එෆ්.ආර්.සී.එස්))

අක්ෂි ශල්‍ය විශේෂඥ
- වෛද්‍ය ඩී. එච්. වාරියපොල මහතා
  (එම්.බී.බී.එස්., ඩී.ඕ එෆ්.ආර්.සී.එස්. (එංගලන්තය), එම්.එස්

රක්තවේදය විශේෂඥ
- වෛද්‍ය සී. කාරියවසන් මහත්මිය
  (එම්.බී.බී.එස්., ඩී.පැත් එම්.ඩී. (රක්තවේදය))

ක්‍ෂුද්‍රජීවි විශේෂඥ
- වෛද්‍ය එස්. කේ. ජයතිලක මිය
  (එම්.බී.බී.එස්., ඩිප්. මෙඩිකල් මයික්‍රො, එම්.ඩී.(ව්‍යාධිවේදය))

ව්‍යාධිවේදය විශේෂඥ
- වෛද්‍ය එම්. ජෝසෆ් මහත්මිය
  (එම්.බී.බී.එස්., ඩී.පැත් එම්.ඩී. (ව්‍යාධිවේදය))
- වෛද්‍ය පී. ජේ. අඹවත්ත මහතා
  (එම්.බී.බී.එස්., ඩී.පැත් එම්.ඩී. (ව්‍යාධිවේදය))
- වෛද්‍ය සොනාලි රොද්‍රිගු මහත්මිය
  (එම්.බී.බී.එස්., ඩී.පැත් එම්.ඩී. (ව්‍යාධිවේදය))

නව්‍යසූති විශේෂඥ
- වෛද්‍ය එම්. වීරසේකර මහත්මිය
  (එම්.බී.බී.එස්., ඩී.සී.එච්., එම්.ඩී. (ළමාරෝග),එම්.ආර්.සී.පී)
  (එක්සත් රාජධානිය)

වකුගඩු රෝග විශේෂඥ
- වෛද්‍ය සී. ඒ. හේරත් මහතා
  (එම්.බී.බී.එස්., එම්.ඩී.)

ධාරක හා නාරිවේදී විශේෂඥ	-	වෛද්‍ය හේමන්ත පෙරේරා මහතා (එම්.බී.බී.එස්., එම්.එස්.එෆ්.ආර්.සී.ඕ.ජී. (මහා බ්‍රිතාන්‍ය) එෆ්.එස්.එල්.සී.ඕ.ජී)
	-	වෛද්‍ය මාධව කරුණාරත්න මහතා (එම්.බී.බී.එස්.,එම්.එස්.,එෆ්.ආර්.සී.ඕ.ජී.,එෆ්.එස්.එල්.සී.ඕ.ජී)
විකලාංග රෝග ශල්‍ය විශේෂඥ	-	වෛද්‍ය ඒ.බී.එස් ආනන්ද පෙරේරා මහතා (එම්.බී.බී.එස්., එම්.එස්., එෆ්.ආර්.සී.එස්.,)
ළමා රෝග විශේෂඥ	-	වෛද්‍ය ආර්. ඒ. ආර්. ඩී ඇලෝසියස් මහතා (එම්.බී.බී.එස්., ඩී.සී.එච්., එම්.ඩී., එම්.ආර්.සී.එල්.,)
කායික රෝග විශේෂඥ	-	වෛද්‍ය අනුලා විජේසුන්දර මහත්මිය (එම්.බී.බී.එස්., එම්.ඩී. (ලංකා), එෆ්.ආර්.සී.පී. (එංගලන්තය) එෆ්.සී.සී.ඩී.පී.එම්. එෆ්.ආර්.ඒ.සී.පී (ගෞරව))
	-	වෛද්‍ය සී. විජේසුන්දර මහත්මිය (එම්.බී.බී.එස්., එම්.ඩී.)
	-	මහාචාර්ය ආර්.එල් සතරසිංහ මහතා (එම්.බී.බී.එස්., එම්.ඩී., එෆ්.ආර්.සී.පී. (එංගලන්ත), එෆ්.ආර්.සී.පී (ලන්ඩන්), එෆ්.ආර්.සී.පී (ග්ලාස්), එෆ්.ආර්.සී.පී (අයර්), එෆ්.ආර්.සී.පී (ඇමෙරිකා එ.ජ), එෆ්.ආර්.සී.පී. (ශ්‍රී ලංකා), එම්.ඒ.සී.පී. (ඇ.එ.ජ) සී.සී.එස්.පී (එක්සත් රාජධානිය))
	-	වෛද්‍ය චින්තක ද සිල්වා මහතා (එම්.බී.බී.එස්., එම්.ඩී. එම්.ආර්.සී.පී. (එක්සත් රාජධානිය))
විකිරණවේදී විශේෂඥ	-	වෛද්‍ය ඩී.ජේ වික්‍රමරත්න මහතා (එම්.බී.බී.එස්., (ලංකා), එම්.ඩී. (විකිරණවේදය)
	-	වෛද්‍ය එන්.එම්.පී.කේ. අරඹේපොල මිය (එම්.ඩී. (විකිරණවේදය))
ශල්‍ය විශේෂඥ	-	වෛද්‍ය පී. ගුණතිලක මහතා (එම්.බී.බී.එස්., (ලංකා), එෆ්.ආර්.සී.එස්)
	-	වෛද්‍ය ඩී. එල්. පියරිස් මහතා (එම්.එස්, එෆ්.ආර්.සී.එස්. (එඩින්බරෝ))
	-	වෛද්‍ය ඩී. එච්. සමරකෝන් මිය (එම්.බී.බී.එස්., එම්.එස්. (කොළඹ), එම්.ආර්.සී.පී (එක්සත් රාජධානිය))
වාතරක්තවේදි විශේෂඥ	-	වෛද්‍ය කේ. කාසිම් මහතා (එම්.බී.බී.එස්., එම්.ඩී.)
ස්නායු වෛද්‍ය විශේෂඥ	-	වෛද්‍ය එච්. එච්. ගුණසේකර මහතා (එම්.බී.බී.එස්., එම්.ඩී., එම්.ආර්.සී.පී)
ස්නායු ශල්‍ය වෛද්‍ය විශේෂඥ	-	වෛද්‍ය එම්. විජේරත්න මහත්මිය (එම්.බී.බී.එස්., (ගෞරව,මෙල්බන්), එම්.එස්., එෆ්.ආර්.සී.එස්.(එඩින්බරෝ))
චර්ම රෝග විශේෂ	-	වෛද්‍ය ඩී. ආරියවංශ මිය (එම්.බී.බී.එස්., එම්.ඩී.)

සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලේ 2011 වාර්ෂික වාර්තාව පල කිරීම වරප්‍රසාදයක් වන අතර, සතුටටද කාරණාවකි. බොහෝ සෙයින් 2011 වර්ෂය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලේ අවිනිශ්චිත කාල වකවානුවක් විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ, සැබෑ තත්ත්වය සොයා නොබලා කෙරුණු අහිතකර ප්‍රචාරයන්ය. මෙම අහිතකර මාධ්‍ය ප්‍රචාරයන් හේතුකොටගෙන සියළුම රෝහල් කාර්ය මණ්ඩලය සහ විශේෂයෙන් වෛද්‍ය විශේෂඥවරු අධෛර්‍යමත් වූහ.

2011 වර්ෂයේ අවසන් කාර්තුවේදී ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය අළුතින් පත්කරන ලදී. මේ සියළු දුෂ්කරතා හා අහිතකර ප්‍රචාරයන් මැද්දේද, පසුගිය වසර සමඟ සසඳන විට එයට වඩා ඉහළ මට්ටමක සේවාවක් පවත්වාගෙන යාමට රෝහලේ කළමනාකරණයට හැකිවී තිබේ.

පසුගිය වසර තුල බාධක අභිබවා ඉදිරියට යාම සඳහා සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මහතාද, සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් ඇතුළු අන් සියලු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද ක්‍රියාශීලි උනන්දුව හා සහයෝගය මතක් කිරීමට කැමැත්තෙමි.

කලින් සිටි සභාපති එන්. ඩබ්. ඊ විජේවන්ත මහතාට සහ කළමනාකාර මණ්ඩලයේ කලින් සිටි සාමාජිකයන් වෙත මගේ ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි.

අධ්‍යක්ෂ මණ්ඩලය, රෝහල් අධ්‍යක්ෂතුමා, රෝහල් ලේකම්තුමිය ඇතුළු විශේෂඥ වෛද්‍යවරුන්, හෙද නිලධාරීන්, අතුරු වෛද්‍ය නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයේ අනිත් සියළු සාමාජිකයන් විසින් දක්වන ලද අඛණ්ඩ කැපවීම, සහයෝගය, උනන්දුව සහ දායකත්වය වෙනුවෙන් ඔවුනට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර
සභාපති
ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලේ 2011 වාර්ෂික වාර්තාව වෙනුවෙන් මෙම පණිවිඩය මා විසින් නිකුත් කරනු ලබන්නේ ඉතා සතුටිනි.

මෙම රෝහලේ අධ්‍යක්ෂවරයා වශයෙන් මම රාජකාරි භාරගත්තේ වසර 2011 හේ මුල් භාගයේදී කුමන හේතුවක් නිසා හෝ මෙම රෝහලේ අධ්‍යක්ෂවරයෙකු හෝ සහකාර අධ්‍යක්ෂවරයෙකු හෝ ගණකාධිකාරිවරයෙකු හෝ සේවයේ නොසිටි අවධියකය.

මෙම ගාස්තු අයකරන තෘතීක සත්කාර රෝහලේ මූලික අරමුණ වන්නේ මහජනතාවට උසස් මට්ටමක රෝගී සත්කාර සේවයක් සහනදායී මිලකට ලබා දීමයි. එසේ කළ හැකි වන්නේ කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවීම් සහ අළුත් යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා වැය වන මුදල් සෞඛ්‍ය අමාත්‍යංශය විසින් දරනු ලබන නිසාය. තවද, මෙම රෝහලේ සම්පූර්ණ භෞතික හා මූල්‍යය කාර්ය සාධන, රජයේ හා පුද්ගලික අංශයේ රෝහල් සමග සැසඳීමේදී බලාපොරොත්තු වූ මට්ටමක නොමැති බව අවධානය කළ හැකිය.

පසු ගිය දස වසර කාලය තුල ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලේ කොළඹ අවට පිහිටි පුද්ගලික රෝහල් හා රජයේ රෝහල් තරම් දියුණු වී නොමැත.

මෙයට අමතරව, මෙම රෝහලට ප්‍රතිකාර ලබාගැනීමට රෝගීන් නොපැමිණෙන අන්දමට කරන ලද අයහපත් මාධ්‍ය ප්‍රතිචාර රෝහලේ දියුණුවට අයහපත් ලෙස බලපා ඇත.

මේ අතර, බලවත් අභියෝග මැද වුවද, විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරින්, හෙද කාර්ය මණ්ඩලය, අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩලය සහ අනිත් සේවකයින් යන අයගේ උනන්දුව හා කැපවීම හේතුකොටගෙන, රෝගීන්ට වඩා හොඳ සත්කාර සේවා ලබා දීම සම්බන්ධයෙන් ඉහළ ඉලක්ක කරා එළඹීමට සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි විය.

2011 වසර තුල මෙම රෝහලේ 5 S සංකල්පය ක්‍රියාත්මක කිරීමෙහිලා කණ්ඩායමක් වශයෙන් උත්සහ දරමින් සහයෝගය දුන් කාර්ය මණ්ඩලයට මගේ ප්‍රසංශාව පලකළ යුතුය.

නුදුරු අනාගතයේ ස්ථිර ගණකාධිකාරිවරයෙකු හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමෙන් මෙම රෝහලට මෙයට වඩා ඉහළ ඉලක්ක කරා එළඹිය හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි.

මහජනතාවට ගුණාත්මක රෝගී සත්කාර සේවයක් සැපයීමෙහිලා අනිත් රෝහල් සමග තරගකාරිව අභිබවා ඉදිරියට යාමට තරම් මෙම රෝහලේ සේවාවන් දියුණු කිරීම අපගේ අභියෝගය වන්නේ.

වෛද්‍ය එස්. ඒ. කේ. ගමගේ
එම්.බී.බී.එස් (ශ්‍රී ලංකා) එම්.එස්.සී (වෛද්‍ය පරිපාලන)
අධ්‍යක්ෂ
ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

මෙහෙයුම් පිළිබඳ බණ්ඩමය සමාලෝචනය

සාමාන්‍ය -

රෝගී සේවා සැපයීම අනුව බාහිර හා අභ්‍යන්තර රෝගී අංශ වශයෙන් සේවා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

බාහිර රෝගී අංශය හදිසි බාහිර රෝගී උපදෙස් ලබාගැනීම, චැනල් සේවාව මගින් වෛද්‍ය හමුව සහ සායනවලින් සමන්විතයි.

අභ්‍යන්තර රෝගී අංශය මූලික වශයෙන්ම ප්‍රතිකාර පටිපාටිය සඳහා ඇතුලත් කරනු ලබන රෝගීන් සඳහා වූ ඒකකවලින් සහ වාට්ටුවලින් සමන්විතය.

භෞතික කාර්ය සාධනයන්ට එහි නිමැයුම් සඳහා බොහෝ සීමාවන් ඇත. ඒවා අතරින් රෝහල් ගාස්තු, රෝගින් මූල්‍යමය හැකියාව වසර තුල ව්‍යාප්ත වන බෝවන රෝග රටාව සහ රජයේ රෝහල් වලින් සේවා සත්කාරයන් නොමිලේ ලබා ගැනීම හේතු වේ. මීට අමතරව සේවක ඌනතාවයන්, ඇතැම් අවස්ථාවලදී උපකරණ නිසිපරිදි ක්‍රියාත්මක නොවීම යනාදී කරුණුද කාර්ය සාධනය සඳහා බලපායි.

ගතවූ වර්ෂය හා සැසඳීමේදී බාහිර රෝගින්ගේ පැමිණීම වැඩිවී ඇති නමුත් රෝගින් ඇතුල්වීමේ සංඛ්‍යාව ඉහත කී හේතුන් නිසා අඩු වී ඇත.

2010 වසර සමග සැසදිමේදි 2011 වර්ෂයේ අභ්‍යන්තර රෝගීන්ගේ අඩුවීමක් වාර්තා වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වූයේ ආයතනය තුළ පැවති අර්බුදකාරී තත්ත්වයයි.

ඇඳන් භාවිතය - Bed Occupancy



රූපසටහන් 2

පසුගිය වර්ෂය පහ සැලකීමේදී ප්‍රස්ථාරයේ පෙන්වා ඇති පරිදි වර්ෂ 2009 දී රෝහලේ ඇඳන් භාවිතය උපරිම අගයක් විය. වර්ෂ 2011 දී ඇඳන් භාවිතය 66.8% විය.

වෛද්‍ය වාට්ටු

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	293	291	288	292	292
රෝගීන් පැමිණීම	41545	38837	38671	37408	36382
රෝගීන් ඇතුලත් කිරීම	16823	17229	17291	17009	16986
ඇඳන් භාවිතය	106%	113%	111%	110%	116%

වෛද්‍ය ඒකකය

ඇඳන් 184 කින් සමන්විත වෛද්‍ය වාට්ටු තුන (6,12,17) වර්ෂ 2011 දී ඉහල දායකත්වයක් දක්වන අතර, ඇඳන් භාවිතයේ සාමාන්‍යය 116% විය. (ඇඳන් භාවිතය වාට්ටු 6 - 121.8%, වාට්ටු 12 - 107.7% , වාට්ටු 17 – 118.1%)

කායික විශේෂඥ වෛද්‍යවරු තිදෙනෙක් සතියකට දෙවරක් සායන 6 ක් පවත්වන අතර මීට අමතරව සෑම සතියකම දියවැඩියාව හා ඇදුම සම්බන්ධ සායනද මෙම රෝහලේ පැවැත්වේ.

2. ළමා වෛද්‍ය ඒකකය

මෙම ඒකකය ඇඳන් 43 කින් සමන්විත වන අතර, කුමන ආකාරයේ හදිසි ළමා වෛද්‍ය ප්‍රතිකාර සඳහා වුවද සර්ලන උපකරණ සහිතව ඇත.

ළමා වෛද්‍ය ඒකකය

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	330	332	336	331	337
රෝගීන් පැමිණීම	3537	4302	4744	7835	7300
රෝගීන් ඇතුලත් කිරීම	2994	3230	3885	3564	3284
ඇඳන් භාවිතය	73%	75%	71%	68%	70%

සෑම සතියකම පවත්වනු ලබන ළමා සායන තුනට අමතරව ළදරු සුවතා සායන, එන්නත් සහ ඇදුම් රෝග සායන මෙම රෝහලේ පවත්වනු ලබයි. ගතවූ වර්ෂය හා සසඳන විට ඇඳන් භාවිතය වැඩි වී ඇත.

ඇඳන් භාවිතය - Bed Occupancy



3. නොමේරූ ළදරු දැඩිසත්කාර ඒකකය (NICU)

ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලෙහි ඇති නොමේරූ ළදරු දැඩිසත්කාර ඒකකය රටෙහි පවතින එවැනි ඒකක අතර හොඳම ඒකකය ලෙස තවදුරටත් එලෙසම පවතී. මෙම ඒකකය ඉතාමත් නොමේරූ සහ අඩුබර උපත් ළදරුවන් රැකබලා ගැනිමට මැනවින් සකසා ඇත. රෝහලේ ප්‍රසූති ඒකකයෙන් පමණක් නොව අනෙකුත් රජයේ සහ පෞද්ගලික රෝහල්වලින්ද රෝගී ළදරුවන් මෙම ඒකකයට යොමු කරනු ලබයි.

2011 වර්ෂය තුලදී මෙම ඒකකයේ ඇඳන් භාවිතයෙහි සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරයි. නොමේරූ ළදරු දැඩි සත්කාර ඒකකයට ඇතුලත් කරනු ලබන රෝගීන් සංඛ්‍යා රැඳා පවතින්නේ රෝහලේ ප්‍රසූති ඒකකයේ උපදින නොමේරූ හා අඩුබර උපත් ළදරුවන් සංඛ්‍යාව මතය. මෙම වර්ෂය තුල නොමේරූ ළදරුවන් 52 දෙනෙකුට මෙම ඒකකයේ “සර්ෆැක්න්ට්” ප්‍රතිකාරය ලබා දී ඇත.

	2007	**2008**	**2009**	**2010**	**2011**
රෝගීන් ඇතුලත් කිරීම	897	937	892	916	824
ඇඳන් භාවිතය	51%	60%	46%	54%	71%

ඇඳන් භාවිතය



4. ප්‍රසව හා නාරිවේදී ඒකකය

ඇඳන් 124 කින් සමන්විත මෙම ඒකකයේ වාට්ටු දෙකෙහි, වර්ෂ 2011 තුල ඇඳන් භාවිතය 83% ක සුවිශේෂි ක්‍රියාකාරී මට්ටමක් පෙන්වයි. ප්‍රසව හා නාරිවේදී රෝගී සත්කාරය සඳහා වූ නවීනතම පහසුකම් මෙම ඒකකය සතුව පවතියි.

4.1 රෝගීන් දැනුවත් කිරීම

මුල් ගර්භණී අවස්ථා හඳුනාගැනීම සඳහා, විශේෂ වෛද්‍යවරයෙකු ප්‍රමුඛ වෛද්‍යවරුන් සහ හෙද සොයුරියන් විසින් පූර්ව ගර්භණී ක්ෂේත්‍ර සායන මෙහෙයවනු ලැබේ. පූර්ව ප්‍රසව පංති පවත්වා ගර්භණී අවස්ථාවේ භෞත චිකිත්ස ව්‍යායාම හඳුන්වා දෙනු ලබන අතර, සූතිකාගාරය පෙන්වා එයින් කෙරෙන සේවාවන් පැහැදිලි කර දෙනු ලැබේ.

4.2 පූර්ව ප්‍රසව සායන

පූර්ව ප්‍රසව සායනයෙහි පරීක්ෂා කරන රෝගී සංඛ්‍යාව සීමා නොකෙරේ. ස්කෑන් හා ඩොප්ලර් පරීක්ෂණ පහසුකම් පූර්ව ප්‍රසව සායනවලදී හා වාට්ටු තුල ලබා ගැනීමේ පහසුකම් සලසා ඇත.

4.3 යොමු කිරීම

ගර්භ වලිප්පුව, බහු ගර්භ හා වර්ධනයේ දෝෂ සහිත ගර්භ ඇතුළු අධි අවදානම් තත්ත්වයෙන් පසුවන ගර්භණී මව්වරුන් දිවයිනේ සෑම දිසාවෙන්ම මෙම ඒකක දෙක වෙත යොමු කෙරේ.

4.4 සේවස්ථ පුහුණු වැඩසටහන්

වෛද්‍ය, හෙද හා ඕඩර්ලි ඇතුළු වාට්ටුවේ කාර්ය මණ්ඩලය සඳහා නිරන්තර සේවස්ථ පුහුණු වැඩසටහන් සෑම සෙනසුරාදා දිනකම පැවැත්වේ.

4.5 අන්තර් ජාතික උපදේශ මාලා පිළිපැදීම

කාර්ය මණ්ඩලය විසින් කෙරෙන සේවයේ ගුණාත්මකභාවය වැඩිකර ගැනීම සඳහා සුදුසු ජාතික හා ජාත්‍යන්තර මාර්ගෝපදේශණ හා මෙහෙයුම් පත්‍ර යොදා ඇත.

4.6 මාතෘ මරණ

ඉතාමත් අසාධ්‍ය තත්ත්වයේ මව්වරුන්ට ප්‍රතිකාර කරනු ලැබුවද, දිවයිනේ අවම මව් මරණ අනුපාතය ඇත්තේ මෙම ඒකකයේය.

4.7 පසු ප්‍රසව සැලසුම්

සෑම මවක් සඳහාම පසු ප්‍රසව සත්කාර ලබා දෙන අතර, ඔවුන් රැක බලා ගැනීමටද, දියවැඩියාව හා අධි රුධිර පීඩනය ආදී රෝග තත්ත්වයෙන් පෙළෙන රෝගීන්ට පවුල් සංවිධාන ක්‍රම සැලසුම් කර දී පසු විපරම් සේවාවද පසු ප්‍රසව කාලය තුල ලබා දෙනු ලැබේ.

4.8 පොදු පහසුකම්

කාර්ය මණ්ඩලයේ දැනුම කාලීනව වර්ධනය කරගැනීම සඳහා අංග සම්පූර්ණ පුස්තකාලයක්ද, අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් පහසුකම් සපයා දී ඇත. අප වාට්ටුවල ඉතා හොඳ සනීපාරක්ෂක තත්ත්වයක් රැකෙන අතර, රෝගීන් සඳහා විනෝදාස්වාද හා පුස්තකාල පහසුකම්ද සපයා දී ඇත.

4.9 සායන

සියළුම රෝගීන් සඳහා බහු විධ ශීක්ෂණයෙන් සපයනු ලැබේ.

4.10 නාරිවේදය

නාරිවේදී ශල්‍යකර්මවල නවීන ක්‍රමවේද භාවිතයෙන් ලැපරොස්කොපි, ලැපරොටොමි, VH & R, TOT, හිස්ටරොස්කොපි සහ යෝනි ප්‍රතිසංස්කරණ ශල්‍යකර්ම සිදු කෙරේ මෙහෙයුම් පත්‍රයට අනුකූලව පසු ශල්‍ය රෝගීන් ඉතා ලගින් අධීක්ෂණය කරනු ලැබේ.

4.11 ශල්‍යකර්ම ක්‍රමවේදය

සියළුම ලැපරොස්කොපි ශල්‍ය ක්‍රම වීඩියෝ පටිගත කර රෝහලෙන් පිටවීමට පෙර රෝගියාට සහ පවුලේ අයට පෙන්වනු ලබන අතර, ඉදිරි සැලසුම් ගැනද සාකච්ඡා කරනු ලැබේ.

4.12 ශල්‍යකර්මයෙන් පසු රෝගී ප්‍රතිකාර

ශල්‍යකර්මයෙන් පසු රෝගී ප්‍රතිකාර කරනු ලබන අතර, පිළිකාමය තත්ත්වය හා IVF ද, පූර්ව ප්‍රසව සායන හා වාට්ටු වැනි දේශීය හා විදේශීය වෙනත් මධ්‍යස්ථානවලට වැඩිදුර සත්කාර සඳහා රෝගීන් යොමු කරනු ලැබේ.

4.13 විගණන

නිතිපතා විගණන කටයුතු සිදුකරන අතර, සොයාගනු ලබන දත්ත සාකච්ඡාවට භාජනය කිරීමෙන් තර්ජිත හා අවදානම් අවස්ථාවලට මුහුණ දීමේ ක්‍රම කළමනාකරණය කරගැනීම සිදු කෙරේ.

4.14 පර්යේෂණ කටයුතු

ප්‍රසව හා නාරිවේදී දෙපාර්තමේන්තුව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය විසින් (PGIM) පිළිගැනෙන පශ්චාත් වෛද්‍ය උපාධි පුහුණු මධ්‍යස්ථානයකි. අර්ථවහරණය, හිස්ටරොස්කොපි ආදිය පිළිබඳ පර්යේෂණද මෙහි පැවැත්වේ. පර්යේෂණ කටයුතුවල සියළුම ශ්‍රේණිවල වෛද්‍ය නිලධාරීන් සහභාගි වෙති.

ඇඳන් භාවිතය



	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	329	291	288	291	294
රෝගීන් පැමිණීම	31109	33026	28290	27277	25421
රෝගීන් ඇතුලත් කිරීම	8213	7720	7777	7810	7871
ප්‍රසූති	4355	4417	4091	3476	3877
ඇඳන් භාවිතය	84%	78%	79%	83%	83%

5. සාමාන්‍ය ශල්‍යකර්ම

කලින් වර්ෂය සමඟ සසඳා බැලීමේදී පසුගිය වර්ෂය තුල සාමාන්‍ය ශල්‍යකර්ම වාට්ටු තුනේම සමස්ථ කාර්ය සාධනය වැඩි වී ඇත.

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	374	435	422	431	444
රෝගීන් පැමිණීම	13531	12863	12895	12633	13001
රෝගීන් ඇතුලත් කිරීම	6770	6759	6284	6358	6763
ශල්‍යකර්ම	4135	4702	4706	3751	3713
ඇඳන් භාවිතය	58%	59%	58%	45%	51%

ඇඳන් භාවිතය



(වර්ෂ 2011 තුල ශල්‍යකර්ම වාට්ටු අංක 15 හි 60.9% ක ඇඳන් භාවිතප්‍රතිශතයක් පෙන්නුම් කරයි)

6. අක්ෂි ශල්‍ය වෛද්‍ය ඒකකය

මෙම ඒකකය නූතන කුඩා Phacomulsification සුද ඉවත් කිරීමේ සැත්කම සඳහා විශේෂත්වයක් උසුලයි. ශල්‍යාගාර පහසුකම් ලෙස ALCON 'INFINITY' Phaco systems දෙකකින්ද, Calisto Vedio Recording System සහිත LUMERA 1 අන්වීක්ෂයකින්ද, Azeiss Opmi 160 අන්වීක්ෂයකින්ද සමන්විත වේ. මෙම පහසුකම් තිබෙන නිසා සුද ඉවත් කිරීමේ සැත්කම ඉතාමත් කුඩා විච්ඡේදනයකින් (2.2 m.m) සිදුකිරීමට හැකිවී තිබේ.

ගතවූ වර්ෂයේ මෙම නූතන ක්‍රම මගින් ආසන්න වශයෙන් 2900 ක් පමණ රෝගීන්ගේ ඇසේ සුද ඉවත් කොට කාච දැමීමේ ශල්‍යකර්ම මෙම ඒකකයේ සිදුකර ඇත.

කාචය මැනීමේදී Non contact IOL master සහ ultrasound A - Scan with immersion යන ක්‍රම දෙක භාවිතා කෙරේ. IOL මගින් කාචයේ ප්‍රබලතාවය ඉතාමත් නිවැරදි ලෙස තක්සේරු කරගත හැකි වේ. මෙමගින් ශල්‍යකර්මයක ප්‍රතිඵල ඉතාමත් සාර්ථකභාවයෙන් යුතුව සහතික කළ හැකි වන්නේය.

මෙම ඒකකයේ Lamellar Keratoplastry ශල්‍යකර්මයද සිදු කෙරේ. Keratoconus සඳහා Deep anterior Lamellar Keratoplasty සහ endothelial රෝග සඳහා Descemets Stripping endothelial Keratoplasty වැනි ශල්‍යකර්ම සිදු කෙරේ. මෙමගින් Penetrating Keratoplasty ශල්‍යකර්මයෙන් සිදුවිය හැකි සංකූලතා හා අතුරු ප්‍රතිඵල අවම කරගත හැකිය. පසුගිය වර්ෂ දෙක තුල මෙම ඒකකයේ Lamellar Keratplasty ශල්‍යකර්ම සිදුකර ඇත.

මෙම ඒකකයේ දෘෂ්ඨි විතාන ආශ්‍රිත ශල්‍යකර්ම සඳහා ද පහසුකම් ඇති අතර, ගතවූ වර්ෂයේ 250 කට ආසන්න රෝගීන් සඳහා මෙම ශල්‍යකර්ම සිදුකර ඇත.

මෙයට අමතරව, මෙම ඒකකයේ ග්ලුකෝමා සහ වපර (Squint) සඳහා ශල්‍යකර්මද, eviscerations සහ enucleastion, dacrocystorhinostomy, cosmetc lid surgery සහ tarsorrhaphy වැනි ශල්‍යකර්මද සිදු කෙරේ.

අක්ෂි සායන සතියකට දින තුනක් පැවැත්වෙන අතර, දළ වශයෙන් මසකට රෝගීන් 1250 ක් පමණ සහභාගි වෙති. මෙම සායනවල දියවැඩියා රෝගීන් (Diabetic Retinopathy),

ග්ලුකෝමා රෝගීන් දුර - ළග පෙනීමේ දුර්වලතා ඇති රෝගීන් සඳහා ද ප්‍රතිකාර කරනු ලබන අතර ළමුන් සඳහා ද සෑම සෙනසුරාදා දිනකම සායන පැවැත්වේ.

දියවැඩියා රෝගීන් (Diabetic Retinopathy) සහ තවත් රෝග සඳහා ලේසර් ප්‍රතිකාරද මෙහිදී සිදු කෙරේ. දළ වශයෙන් Focul Laser Treatment (FLT) ලේසර් ප්‍රතිකාර 55 ක් සහ Pan Retinal Photocoagulation (PRP) ප්‍රතිකාර 45 ක් පමණ මසක් තුල සිදු කෙරේ.

Age Related Macular Degeneration (ARMD) යන රෝගී තත්ත්වය හඳුනා ගැනීම සහ නිසි පාලනය සඳහා අවශ්‍යවන Flourescien Angiography සහ Indocyanin green angiography යන ඩයි පරීක්ෂණ සිදුකිරීම සඳහා ද පහසුකම් මෙම ඒකකයේ ඇත. Iodopathyic Polypoidal Choroido Vasculopathy (IPCV) යන රෝගී තත්ත්වයට Photodynamic Therapy ලේසර් ප්‍රතිකාර සිදුකරන දිවයිනේ එකම ඒකකයද මෙය වේ.

විශේෂයෙන් ග්ලුකෝමා රෝගීනගේ ඇස සහ කෝණය පරීක්ෂා කිරීමට වැදගත් වන Anterior Segment OCT නැමැති ස්කෑන් යන්ත්‍රයේ පහසුකම ඇත්තේ ද මෙම ඒකකයේ පමණි. B-Scan Ultrasound යන්ත්‍ර සහ Corneal Topoggrapher යන්ත්‍ර මෙහි ඇති තවත් පහසුකම්ය.

මෙම ඒකකයේ විවිධ සමීක්ෂණ සිදුකරන අතර, පසුගිය වසරේ සමීක්ෂණ පත්‍ර 07 ක් ඉදිරිපත් කර ඇත. ඒ සමීක්ෂණ මාතෘකා වූයේ "Lamellar Keratoplasty prodedures DEEK AND DALK", "Phacomulsification with intraocular lens implant", "Hand held study during Phacoemulsification", "Vitiliform macula Degeneration", "The difference between metal and diamond knife in wound healing in Phacoemulsification". යන ඒවාය.

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	146	140	140	140	144
රෝගීන් පැමිණීම	15341	14425	14837	14651	14538
රෝගීන් ඇතුලත් කිරීම	1842	1931	1931	1742	1766
ඇඳන් භාවිතය	69%	70%	68%	58%	61%
ශල්‍යකර්ම	3304	3746	3814	3782	3506



7. උගුර කණ නාස ඒකකය (Autolaryngology – ENT)

ගතවූ වර්ෂ සමග සැසඳීමේදී ඇඳන් භාවිතාය, රෝගීන් ඇතුලත් කිරීම හා රෝගීන් පැමිණීම සම්බන්ධව ඒකකයේ කාර්ය සාධනය සතුටුදායක නොවන්නේය. සතියකට පවත්වන ලද සායන සංඛ්‍යාව 03 සිට 02 දක්වා අඩු වී ඇත.

2011 වර්ෂයේ කථනය සම්බන්ධ ඒකකයෙන් රෝගීන් 608 දෙනෙකුට ප්‍රතිකාර ලබාදී ඇත. අභ්‍යන්තර හා සායන රෝගීන් සඳහා ශ්‍රවනේන්ද්‍රිය සේවා සපයනු ලබන අතර එය වෛද්‍ය පරීක්ෂණ යෝජනා ක්‍රමයෙහි කොටසක් ද වේ. 2011 වසර තුල ශ්‍රවනේන්ද්‍රිය සේවා 1220 ද, Tympanograms 818 ද සිදු කර ඇත.

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	98	101	99	99	98
රෝගීන් පැමිණීම	7515	7729	7554	7064	6382
රෝගීන් ඇතුලත් කිරීම	1877	1730	1558	1477	1314
ඇඳන් භාවිතය	47%	42%	38%	34%	30%
ශල්‍යකර්ම	724	766	690	687	543
කථන ප්‍රතිකාර (Speech Therapy)	1225	1121	327	666	608

8. විකලාංග ඒකකය

2011 වර්ෂය තුල දණහිස් ප්‍රතිසංවිධාන ශල්‍යකර්ම 82 ක්ද, උකුල් ඇට ප්‍රතිසංවිධාන ශල්‍යකර්ම 30 ක්ද, මෙම ඒකකය මගින් සිදුකර ඇත.

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	96	95	98	98	99
රෝගීන් පැමිණීම	7810	8029	8761	8395	8721
රෝගීන් ඇතුලත් කිරීම	2167	2206	2159	2240	1984
ඇඳන් භාවිතය	82%	88%	112%	65%	61%
ශල්‍යකර්ම සංඛ්‍යාව	3072	3193	3928	2202	1966



9. හෘද උරස් ඒකකය

උපදේශක හෘද උරස් ශල්‍ය වෛද්‍යවරු දෙදෙනෙකු විසින් මෙහෙයවනු ලබන මෙම විශේෂිත ඒකකය ළමා හෘද ශල්‍යකර්ම සඳහා කීර්තියක් ලබා ඇති අතර දැන් ධමනි නාලිකා බද්ධ කිරීම (Coronary Artery Bypass Grafting) ඇතුලු වැඩිහිටි හෘද රෝගීන්ගේ සැත්කම්වලටද ඉල්ලීමක් ඇත. රෝගීන් බොහෝමයක් රටේ විවිධ පලාත්වලින් යොමු කරනු ලබයි. පසුගිය අවුරුදු සමග සැසඳීමේදී මෙම ඒකකයේ කාර්ය සාධනය මෙම වර්ෂය තුල වර්ධනය වී නොමැත. මෙම වර්ෂය තුළ සිදුකරන ලද ශල්‍යකර්ම 207 න් 162 ක් ධමනි නාලිකා බද්ධ කිරීමේ ශල්‍යකර්ම (Coronary Artery Bypass Grafting - CABG) වේ. සම්පූර්ණ ශල්‍යකර්ම සංඛ්‍යාව 17 කින් පහළ බැස ඇති අතර, මෙයට හේතු වශයෙන් 2007 දී රිජ්වේ ආර්‍යා රෝහලේ සහ මහනුවර ශික්ෂණ රෝහලේ නව ඒකක ආරම්භ කර තිබීමත්, එහි මුදල් අයකිරීමක් නොමැතිව ශල්‍යකර්ම කරගැනීමට හැකි වීමත් දැක්විය හැකිය. තවද, හෘද රෝග සැත්කම් සඳහා භාවිතා කරන ද්‍රව්‍යවල (Consumables) මිල ඉහල යාම නිසා හෘද ශල්‍යකර්ම සඳහා අධික මුදලක් වැය කිරීමට මහජනතාවට සිදු වී ඇත.

	2007	2008	2009	2010	2011
පැවැත්වු සායන	97	91	96	100	94
රෝගීන් පැමිණීම	4831	4238	4069	4015	3663
රෝගීන් ඇතුලත් කිරීම	805	621	667	644	485
ඇඳන් භාවිතය	65%	53%	66%	56%	87%
ශල්‍යකර්ම සංඛ්‍යාව	357	259	239	224	205



10. හෘද රෝග හා හෘද රෝග පරීක්ෂණ ඒකකය

ඒකකයේ සායනික පැමිණිම සහ රෝගීන් ඇතුළත් කිරීමේ පිළිවෙත වෙනත් අංශවලින් යොමු කෙරෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමයි. ගතවු වර්ෂය සමඟ සැසඳීමේදී මෙම ඒකකය මගින් කෙරුණු එකෝකාඩියෝග්‍රෑම් පරීක්ෂණ :103 කින්ද, ප්‍රත්‍යබල පරීක්ෂණ සංඛ්‍යාව 85 කින්ද, වැඩි වී ඇත. පසුගිය වසරේ ඇම්බියුලේටරි රුධිර පීඩන පාලන ඒකකයක් මිලදී ගැනීමෙන් මෙම අංශයෙන් කෙරෙන පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කරගත හැකි වී ඇත. වර්ෂ 2011 දී කැතීටර සායනාගාරයෙන් අන්ජියෝග්‍රෑම් 542 ක් සිදු කර ඇත.

හෘද රෝග හා හෘද රෝග පරීක්ෂණ ඒකකය

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	91	95	97	99	99
රෝගීන් පැමිණීම	4304	5040	5027	5234	5582
රෝගීන් ඇතුලත් කිරීම	1248	1651	1813	1829	1944
ඇඳන් භාවිතය	50%	60%	68%	52%	56%
එකෝකාඩියෝග්‍රෑම්	9858	10854	12199	12360	12463
ප්‍රත්‍යබල පරීක්ෂණ	1743	1863	2000	2050	1965
කොරනරි ඇන්ජියෝග්‍රෑම්	367	432	445	483	542
තාවකාලික පේස් මේකර්	3	7	22	16	18
ස්ථිර පේස් මේකර්	4	7	13	10	21
කැතීටකරණය					
දකුණු හෘද කොරනරි	15	6	2	1	3
පර්සියුටේනියස් ට්‍රාන්ස්ලුමිනල්					
කොරනරි ඇන්ජියෝග්‍රෑම්	69	94	77	103	121
හොල්ටර් මොනිටරිං පරීක්ෂණ	248	42	20	297	387

11. ඒන්ඩෝස්කොපි ඒකකය

ආන්ත්‍රික හා උදරාබාධ ආශ්‍රිත රෝගීන් සඳහා පරීක්ෂණ සහ ප්‍රතිකාර මෙම ඒකකයේ සිදු කෙරේ. ශල්‍ය වෛද්‍යවරුන්ට අමතරව කායික රෝග වෛද්‍යවරුන් විසින්ද පරීක්ෂණ පැවැත්වීම නිසා මෙම ඒකකයේ කාර්ය සාධනය පසු ගිය වසර දෙක තුලදී වැඩිදියුණු වී ඇත. වර්ෂ 2008 සිට 2011 දක්වා කාලය තුල ඊ.ආර්.සී.පී. චිකිත්සාවල සැලකිය යුතු අඩුවීමක් සිදුවී ඇත. මීට ප්‍රධාන හේතුව වන්නේ අනෙකුත් රෝහල්වලින් එන්ඩොස්කොපි සඳහා රෝගීන් යොමු නොකිරීම හා එම රෝහල්වල මෙම ප්‍රතිකාරය නොමිලේ ලබා දීමද වේ. කෙසේ වෙනත් කාර්ය සාධනයෙන් 46% ක්ම වාට්ටු අංක 6 හි රෝගීන් සඳහා බව සැලකයි යුතුය.

ඒන්ඩෝස්කොපි ඒකකය

	2007	2008	2009	2010	2011
ජී. අයි. එන්ඩොස්කොපි	1535	1579	1832	1754	1759
කොලොනොස්කොපි	76	380	531	552	653
ඊ. ආර්. සී. පී	43	33	21	24	15
සෙලොරොතෙරපි	2	8	11	2	0
බ්‍රොන්කොස්කොපි	45	46	41	35	25
එසෝෆැගියල් බෑන්ඩිං	198	203	166	210	226
සම්පූර්ණ පරීක්ෂණ සංඛ්‍යාව	1899	2249	2915	2867	3020

12. වෘක්කවේදි හා කාන්දුකරණ ඒකකය

2011 වසරේ මෙම ඒකකයේ කාර්ය සාධනයේ දියුණුවක් ඇත. රෝගීන් පැමිණීමේ සුළු අඩු වීමක් දක්නට ලැබෙන අතර, කාන්දුකරණය සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇති බව පහත වගුවෙන් පෙනේ.

2011 වසරේ වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්ම දොළහක් (12) සිදුකර ඇත. මෙම ශල්‍යකර්ම සඳහා මුල්‍යමය ආධාර ජනාධිපති අරමුදලින් රෝගීන් වෙත ලබා දෙන ලදී. ශල්‍යකර්මවලින් පසු ලබා දෙන ඖෂධවල මිල ඉතා අධික බැවින්, සාකච්ඡාවලින් පසු එම ඖෂධ නොමිලේ රෝගීන්ට ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යාංශය එකඟ වී ඇත.

වෘක්කවේදී හා කාන්දුකරණ ඒකකය

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	146	147	144	142	142
රෝගීන් පැමිණීම	10137	9031	9446	9876	9751
ඇඳන් භාවිතය	75%	88%	87%	86%	73%
කාන්දුකරණ සංඛ්‍යාව	3838	4072	4460	4668	4700
Renal Biopsy	88	78	75	76	66

කාන්දුකරණ සංඛ්‍යාව (No. of Dialysis)



❖ ඇඳන් භාවිතය ගණනය කිරීමේදී නිවැරදි කිරීම් රෝහල් මණ්ඩලයේ අනුමැතිය ඇතිව කරන ලදී.

13. ව්‍යාධි වේදී සේවා

රෝහලේ රසායනාගාරයේ ක්‍රියාකාරිත්වය ඉතා නවීන විද්‍යුත් සහ ස්වයං විශ්ලේෂණ උපකරණවලින් සමන්විත බැවින් විශ්ලේෂණ රසායනාගාර වාර්තා ඉතා ඉක්මනින් ලබාගත හැකිය.

	2007	2008	2009	2010	2011
ජෛව රසායන පරීක්ෂණ	275383	397042	396226	379259	401098
රුධිර විද්‍යාව පරීක්ෂණ	199891	209637	250537	245175	250878
පටක විද්‍යාව පරීක්ෂණ	19854	29627	24301	23484	22405
ක්ෂුද්‍රජීව විද්‍යාව නිදර්ශක	56733	84020	69225	76584	63526
බාහිර රෝගී රසායනාගාර	45432	65509	61072	48495	45296
එකතුව	597293	785835	801361	772997	783203

(එක් එක් නිදර්ශකයකින් පරීක්ෂණ 3-5 සිදු කර ඇත)

14. රෝහල් ලේ බැංකුව

රෝහලේ ලේ බැංකුව පැය 24 පුරාම සේවය සපුරයි. මෙය ස්වාධීන ඒකකයක් වශයෙන් කළමනාකරණ කරනු ලබන නිසා, පාරිභෝගික ද්‍රව්‍යවල හිඟය මෙන්ම අවශ්‍ය ප්‍රමාණයට ලේ තොග නොමැතිවීම වැනි ප්‍රායෝගික ගැටළුවලට මුහුණ දීමට ආයතනයට සිදුවිය. මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා, වර්ෂ 2005 දී සෞඛ්‍ය හා පෝෂණ

අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව, ජාතික ලේ දීමේ සේවය (NBTS) ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ගිවිසුමත් සමඟ ශ්‍රීජයවර්ධනපුර මහාරෝහලට ජාතික ලේ දීමේ සේවයෙන් පාරිභෝගික ද්‍රව්‍ය නොමිලේ සපයනු ලබන අතර, රෝගීන්ට සියළුම ලේ වර්ග හා රුධිර නිෂ්පාදන නොමිලේ සපයනු ලැබේ.

මෙම ඒකකය මගින් විශේෂිත හෘද උරස් හා වකුගඩු බද්ධ කිරීම වැනි ශල්‍යකර්ම සඳහාද, නොමේරූ දැඩි සත්කාර ඒකකයට මෙන්ම වෛද්‍ය, ශල්‍ය, නාරිවේද, හා ප්‍රසූති ඒකකයන් වෙතද රුධිර උපාංග සපයනු ලැබේ. ලේ නිකුත් කිරීමට පෙර ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශයන්ට අනුකූලව පරීක්ෂණවලට ලක් කරනු ලැබේ. ස්වේච්ඡාවෙන් ලේ දන් දෙන අයගෙන් ලේ ලබාගැනීම සඳහා ජංගම ලේ එකතු කිරීමේ සේවාවක්ද මෙම ඒකකය සතුය.

15. විකිරණ දෙපාර්තමේන්තුව

වර්ෂ 2010 සමග සැසඳීමේදී 2011 වර්ෂයේ සී.ටී. ස්කෑන් සේවයේ ඉහළ යෑමක් දක්නට ලැබේ. සියලුම සී.ටී ස්කෑන් 2008 වර්ෂයේදී මහරගම පිළිකා රෝහල වෙත යොමු කරන ලදී. වර්ෂ 2011 දී සී.ටී. ස්කෑන් පරීක්ෂණ ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලේදී සිදුකරන ලද අතර, එම පරීක්ෂණ සංඛ්‍යාව 5568 කි.

විකිරණ දෙපාර්තමේන්තුව

	2007	2008	2009	2010	2011
එක්ස්රේ කරනු ලැබූ රෝගීන් සංඛ්‍යාව	38721	49174	42526	40433	40520
එක්ස්රේ පරීක්ෂණ	47440	59685	50140	46738	46975
සී.ටී ස්කෑන් අධ්‍යයන	973	0	4213	4728	5568
අල්ට්‍රා සවුන්ඩ් ස්කෑන්	5536	7816	8834	8906	8519
අයි. වී. පී	354	341	185	79	36
මැමෝග්‍රෑම්	171	222	424	407	364

16. ගෙවන වාට්ටු

16.1 (1 වන පංතිය)

රූපවාහිනි සහ දුරකථන පහසුකම් සහිත වායු සමනය කරන ලද කාමර 18 ක් මෙම වාට්ටුවේ (වාට්ටු අංක 3) තිබේ. මෙම කාමර සඳහා ඉතා ඉහළ ඉල්ලුමක්ද තිබේ.

1 වන පංතිය

	2007	2008	2009	2010	2011
ඇතුලත් වීම්	1573	1578	1764	1840	1632
ඇඳන් භාවිතය	98%	102%	108%	104%	98%

16.2 (2 වන පංතිය)

	2007	2008	2009	2010	2011
ඇතුලත් වීම්	4837	5367	5625	5153	4674
ඇඳන් භාවිතය	50%	55%	55%	46%	42%

මෙම දෙවන පංතියේ ගෙවන වාට්ටුව ඇඳන් 90 කින් යුක්ත වාට්ටු දෙකකින් සමන්විතය. (වාට්ටු 04, 44, වාට්ටු 5, 46). වර්ෂ 2010 සමඟ සසඳා බලන කල මෙම වාට්ටු දෙකෙහි සමස්ථ ඇඳන් භාවිතය හා ඇතුල්වීම අඩු වීමක් පෙනේ.

17. සාමාන්‍ය දැඩි සත්කාර ඒකකය

	2007	2008	2009	2010	2011
හෘද කිරිට ඒකකය(CCU)	361	382 }	945	923	966
දැඩි සත්කාර ඒකකය(ICU)	352	369 }			
මරණ සංඛ්‍යාව සහ	176	192	188	206	200
එම ප්‍රතිශතය	22.5%	25.5%	20%	22.3%	22%
ඇඳන් භාවිතය	111%	100%	101%	107%	78.3%

ඇඳන් භාවිතය 78.3 % වේ. මරණ ප්‍රතිශතය 20 % - 30 % වේ. මෙයට හේතුව වන්නේ දැඩි සත්කාර ඒකකයට ඇතුලත් කිරීමට පෙර වෙනත් තැනකදී හෘද ස්වසන පද්ධතියේ ක්‍රියාකාරිත්වය නතර වූ රෝගීන් ඇතුලත් කිරීමයි.

18. භෞතික චිකිත්සක දෙපාර්තමේන්තුව

මෙම ඒකකයේ සමස්ථ කාර්ය සාධනය අඩුවී ඇත.

භෞතිකිත්සක දෙපාර්තමේන්තුව

	2007	2008	2009	2010	2011
අලුත් රෝගීන් සංඛ්‍යාව	2228	2013	1703	-	-
රෝගින් පැමිණීම	26365	19819	17150	-	-
ලබාදුන් ප්‍රතිකාර සංඛ්‍යාව	36089	29969	27621	-	-
පෙනහළු ක්‍රියාකාරිත්ව					
පරීක්ෂණ සංඛ්‍යාව	281	209	89	-	-

19. ඊ. සී. ජී / ඊ. ඊ. ජී දෙපාර්තමේන්තුව

පුහුණු ශිල්පි සේවයේ ලබාගැනීමේ හේතුවෙන් මෙම වර්ෂයේ කරන ලද ඊ.ඊ.ජී. (Electro Encephalograms) පරීක්ෂණ සංඛ්‍යාව වැඩි වීමක් පෙන්නුම් කරයි.

	2007	2008	2009	2010	2011
ඊ.සී.ජී.	33971	36086	37960	38166	36156
ඊ.ඊ.ජී.	347	265	487	446	487
ඊ.එම්.ජී.			863	860	1063

ඊ. සී. ජී සංඛ්‍යාව



20. ස්නායු වේද ඒකකය

ස්නායු වේද ඒකකය 2007 දී ස්ථාපනය කරන ලද අතර, මෙම ඒකකය සඳහා අංක 16 A වාට්ටුවේ ඇඳන් 8 ක් වෙන් කර ඇත.

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	115	97	96	96	102
රෝගීන් පැමිණීම	1232	1355	2394	2063	2615
රෝගීන් ඇතුලත් කිරීම	54	167	140	81	128
ඇඳන් භාවිතය	21 %	73 %	117 %	15 %	27 %



21. වාතරක්තවේද ඒකකය

මෙම ඒකකය 2007 දී ස්ථාපනය කරන ලද අතර, මෙම ඒකකය සඳහා වාට්ටු අංක 16 A හි ඇඳන් 8 ක් වෙන්කර ඇත.

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	145	142	143	144	142
රෝගීන් පැමිණීම	2046	2332	3581	4287	3727
රෝගීන් ඇතුලත් කිරීම	70	128	115	118	65
ඇඳන් භාවිතය	17 %	38 %	38 %	13 %	10 %



22. ස්නායු ශල්‍ය වෛද්‍ය ඒකකය

ස්නායු ශල්‍ය වෛද්‍ය ඒකකය 2007 දී අංක 16 B වාට්ටුවේ ස්ථාපනය කරන ලද අතර, 2010 දී දැඩි සත්කාර පහසුකම් සහිත වෙනමම වාට්ටුවකට (වාට්ටු අංක 18) මාරු කරන ලදී.

	2007	2008	2009	2010	2011
පැවැත්වූ සායන	72	93	95	93	92
රෝගීන් පැමිණීම	434	693	1132	850	650
රෝගීන් ඇතුලත් කිරීම	245	841	1015	963	763
ඇඳන් භාවිතය	82 %	363 %	40 %	83 %	34 %
ශල්‍යකර්ම	98	196	340	194	67



23. චර්ම රෝග ඒකකය

චර්ම රෝග ඒකකය 2009 දී ස්ථාපනය කරන ලද අතර, මෙම ඒකකය භාරව සිටින්නේ චර්ම රෝග විශේෂඥ වෛද්‍ය ඩී. ආරියවංශ මහත්මියයි.

	2009	2010	2011
පැවැත්වූ සායන	171	188	193
රෝගීන් පැමිණීම	3659	4321	4972
රෝගීන් ඇතුලත් කිරීම	35	57	52
ඇඳන් භාවිතය	6%	9%	8%

24. පෝෂණ ඒකකය

පෝෂණ ඒකකය ආරම්භ කරන ලද්දේ අභ්‍යන්තර රෝගීන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමේ සහ ආහාරමය ප්‍රතිකාර මුල්කරගත් පෝෂණ උපදෙස් ලබා දීමේ අරමුණින්ය. අභ්‍යන්තර හා බාහිර රෝගීන්ට වෙන් වෙන්ව පුද්ගලිකවම පෝෂණ තක්සේරු කිරීම් සහ ආහාරමය උපදෙස් ලබා දීමත් මෙහිදී සිදුකෙරේ. උදාහරණ: කොලෙස්ට්‍රෝල් අධික වීම (Hypercholesterolemia), දියවැඩියාව (Diabetics mellitus), ස්ථූලතාවය (Obesity) අදිය වේ. මේ සඳහා බාහිර රෝගීන්ගෙන් රු. 100 ක් පමණක් අය කරනු ලැබේ. වර්ෂ 2011 දී ආසන්න වශයෙන් සායන රෝගීන් 844 දෙනෙක් පෝෂණ උපදෙස් සඳහා යොමු කරන ලදී. රෝගීන්ගේ මෙන්ම කාර්ය මණ්ඩලයේ ආහාරමය සැලසුම් සඳහා ද පෝෂණ මගපෙන්වීම සිදු කෙරේ. එක් එක් අභ්‍යන්තර රෝගීන්ගේ පෝෂණ අවශ්‍යතා අනුව

ඔවුන්ට විශේෂ ආහාර වට්ටෝරු නියම කෙරේ. වයඹ සරසවියේ පෝෂණවේදී උපාධි අපේක්ෂකයින්ගේ පුහුණුවද මෙම ඒකකය මගින් ඉටු කරන ලදී.



25. නිර්වින්දන දෙපාර්තමේන්තුව (Anaesthesiology)

ප්‍රධාන ගොඩනැගිල්ලේ ශල්‍යාගාර 8 ක සහ නව හෘද රෝග ගොඩනැගිල්ලේ පිහිටි ශල්‍යාගාර 2 ක උපදේශක වෛද්‍යවරු 4 දෙනෙකු සහ කණිෂ්ඨ නිර්වින්දන වෛද්‍යවරු 17 දෙනෙකු විසින් නිර්වින්දන සේවා සපයනු ලැබේ. හදිසි සැත්කම් සඳහා එක් අංශයකට එක් ශල්‍යාගාරයක් වශයෙන් යොදා ගනිමින් දිනපතාම පැය 24 පුරාම සියළුම ශල්‍යාගාර ක්‍රියාත්මක වේ.

අවශ්‍ය අවස්ථාවලදි එන්ඩොස්කොපි සහ විකිරණ පරීක්ෂණ සඳහාද දැඩි සත්කාර ඒකකයටද, හෘද දැඩි සත්කාර ඒකකයටද, හෘද උරස් දැඩිසත්කාර ඒකකයටද, කැතීට රසායනාගාරයටද, හදිසි ප්‍රතිකාර අංශයටද නිර්වින්දන සේවා සපයනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රසූතිකාගාරයට අවශ්‍ය එපිඩියුරල් ඇනැල්ගීසියා (Epidural Analgesia) නිර්වින්දන සේවා සැපයෙන අතර, හෘදය නැවතීම (Cardiac Arrest) පිළිබඳ ඇමතුම් සඳහා දවසේ පැය 24 පුරාම මෙම දෙපාර්තමේන්තුවෙන් සේවා සැපයේ. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල විධිමත් පදනමක් මත නිර්වින්දන එම්. ඩී. උපාධිය හා හෘද උරස් නිර්වින්දනය සඳහා පිළිගත් පුහුණු මධ්‍යස්ථානයක්ද වේ.

26. මානව සම්පත් වර්ධනය

සේවක පුහුණුව

රෝගී සත්කාරය පිළිබඳ සුළු සේවකයින්ගේ දැනුම හා හැකියාවන් වර්ධනය කිරීම සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් කිහිපයක්ම වර්ෂය තුල පවත්වන ලදී.

26.1 සියළුම සෞඛ්‍ය කළමනාකරණ සහායකයන්ට කාර්යාල පටිපාටිය පිළිබඳව දවසක වැඩමුළුවක් පවත්වන ලදී.

26.2 ප්‍රමිති පාලනය හා අවිනිශ්චිත මිනුම්, ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය ඇරඹීම, රුධිර සාම්පල රැස් කිරීම ආදිය සම්බන්ධව පුහුණු වැඩසටහන් සහ වැඩ සමුළු සඳහා වෛද්‍ය රසායනාගාර ශිල්පීන් යවනු ලැබුහ. හෙද නිලධාරින් සඳහා දින දෙකක පුහුණු වැඩසටහන් 06 ක්ද, දවසක පුහුණු වැඩසටහන් 14 ක්ද පවත්වන ලදී.

හෙද නිලධාරින් සඳහා අවුරුද්ද මුළුල්ලේ පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර, හෙද නිලධාරින් 13 දෙනෙකු මානසික රෝග සම්බන්ධ හා වින්නඹු සත්කාරය පිළිබඳ දිගු කාලීන පුහුණු වැඩසටහන්වලට යවන ලදී.

වෛද්‍ය අධ්‍යාපනය

මෙම වසර තුළ, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය වෛද්‍ය පීඨයෙන් සහ විදේශ විද්‍යාලවලින් පැමිණි වෛද්‍ය සිසුන් 100 කට වැඩි පිරිසක් මෙම රෝහලේ සායනික පුහුණු ලබා ගත්හ.

මෙම වසර තුළ, ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලේ සායනික සංගමය විසින් මෙහෙයවන ලද සායනික රැස්වීම් 33 ක් පවත්වන ලද අතර, එයින් අනතුරුව වාර්ෂික අධ්‍යාපන සැසියද පවත්වන ලදී.

27. වෛද්‍ය පරීක්ෂණ ඒකකය

2004 මැයි මස නව ගොඩනැගිල්ලේ බිම්මහලට වෛද්‍ය පරීක්ෂණ ඒකකය ගෙන යන ලදී. විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් අප වෙත යොමු කරන ලද විදේශ රැකියා අපේක්ෂයකින් සඳහා මෙම ඒකකය මගින් අවශ්‍යතා සැපයේ. 2011 දී වෛද්‍ය පරීක්ෂණ සඳහා පෙනී සිටි සංඛ්‍යාව 4086 වේ. විධායක නිලධාරින් සඳහා වෛද්‍ය පරීක්ෂණ පැකේජද මෙම ඒකකයේ ක්‍රියාත්මක වන අතර, 2011 දී විධායක වෛද්‍ය පරීක්ෂණ පැකේජ 724 ක් ක්‍රියාත්මක වේ.

චැනල් සේවාව

2006 සිට 2009 දක්වා කාලය තුලදී චැනල් කරීම සඳහා වූ රෝගින් සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය විය.

	2007	2008	2009	2010	2011
චැනල් කිරීම සඳහා වූ රෝගීන් සංඛ්‍යාව	9451	13178	15869	14205	10205

කාර්ය මණ්ඩලය

2011 දෙසැම්බර් 31 දිනට

විධායක නිලධාරීන්	16
වෛද්‍ය විශේෂඥයින්	33
ස්ථිර වෛද්‍ය නිලධාරීන්	41
වෛද්‍ය නිලධාරීන් (කොන්ත්‍රාත් පදනම මත)	69
සීමාවාසික වෛද්‍ය නිලධාරීන්	33
පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ පුහුණු වන්නන්	58
වෛද්‍ය නිලධාරීන් (වාර්ෂික ස්ථාන මාරුවීම් මත)	05
ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණිවල නිලධාරීන්	131
අතුරු කාර්ය මණ්ඩලය	95
වෙනත් කාර්ය මණ්ඩලය	94
සුළු සේවකයින්	405
හෙදි සොයුරියන්	28
හෙද කාර්ය මණ්ඩලය	497
සිසු හෙදියන්	103
එකතුව	**1608**

සංස්ථාමය පාලනය

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් පල කරන ලද "රාජ්‍ය ව්‍යාපාර සඳහා සංස්ථා පාලනයේ විශිෂ්ඨ ව්‍යවහාර සංග්‍රහය" නම් වූ අත්පොත ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලේ මණ්ඩලයට මග පෙන්වයි. සාමාන්‍යයෙන් රෝහල ආරම්භ කළ දින සිට මෙතෙක් පත්වූ මණ්ඩල මෙම සංග්‍රහයේ අඩංගු මුලධර්ම ක්‍රියාත්මක කර ඇත.

මණ්ඩලය සහ සාමාජිකයින්

ඇමතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයින් අට (08) දෙනෙකුගෙන් සහ නිලබලයෙන් පවත්වනු ලබන සාමාජිකයින් තුන් (03) දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වෙයි. රෝහලේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ සහ එදිනෙදා පරිපාලනමය කටයුතු සඳහා කළමනාකාරිකමිටුව මගින් ගන්නා තීරණ ක්‍රියාත්මක කරනු ලබන්නේ රෝහල් අධ්‍යක්‍ෂ තුමා විසිනි.

ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් මණ්ඩල පනතේ 9 වන වගන්තිය යටතේ, විටින් විට අවශ්‍ය විධාන නිකුත් කිරීමට සෞඛ්‍ය ඇමතිතුමාට බලය පැවරී ඇත.

විධායක නොවන මණ්ඩලීය සාමාජිකයෝ රෝහලේ එදිනෙදා කටයුතු සහභාගි නොවූවද, මෙහෙයුම් ක්‍රියාවලි සම්බන්ධව සමීප අධ්‍යයනවල යෙදෙති. මණ්ඩලීය සාමාජිකයන්ගෙන් දෙදෙනෙක් සියලුම භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ මණ්ඩලයේ සාමාජිකයින් ලෙසද, එක්කෙනෙක් අයවැය සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ කමිටුවේ සාමාජිකයෙකු ලෙසද ක්‍රියා කරති. විගණන කමිටුවේ සභාපති ලෙස අසුන් ගන්නේ භාණ්ඩාගාරයේ නියෝජිතවරයාය.

මණ්ඩලීය සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය

අංක PED 04 හා 2003.01.01 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ දක්වා ඇති පදනම මත සභාපතිගේ සහ මණ්ඩලීය සාමාජිකයින්ගේ පාරිශ්‍රමික ගෙවනු ලැබේ.

කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂකතුමාගේ සභාපතිත්වය යටතේ ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලේ පනත අනුව කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය සමන්විත වන අතර, රෝහලේ එදිනෙදා කටයුතු පාලනය කරමින් මණ්ඩලයට අවශ්‍ය උපදේශනාත්මක කාර්යන්ද ඉටු කරයි.

විගණන කමිටුව

මණ්ඩලය සඳහා පත්කර ඇති භාණ්ඩාගාරයේ නියෝජිතවරයාගේ සභාපතිත්වය යටතේ මණ්ඩලයේ විධායක නොවන වෙනත් සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විතව විගණන කමිටුව ක්‍රියාත්මක වෙයි. කමිටු ලේකම් වශයෙන් අභ්‍යන්තර විගනන නිලධාරි ක්‍රියා කරයි. විගණන කමිටු රැස්වීම්වලදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරිවරයා ආරාධනා මත නිරීක්ෂකයෙකු ලෙස සහභාගි වෙයි.

රෝහලේ මුල්‍යමය කටයුතු, ක්‍රියාකාරිත්වය, හා කාර්‍ය්‍ය සාධනය ආදී කරුණු සම්බන්ධව අධීක්ෂණය කිරීමටද, පාලනය කිරීමටද, නිසි උද්යෝගීමත් භාවය ක්‍රියාත්මත කිරීමටද විගණන කමිටුවට බලය පැවරී ඇත.

ආචාර ධර්ම ව්‍යවහාර සංග්‍රහය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත ලේඛනය් අන්තර්ගත මූලධර්මයන් මග පෙන්වීමක් වශයෙන් යොදාගනු ලැබේ.

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල් මණ්ඩලය

තලපත්පිටිය, නුගේගොඩ.

2011 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය

	සටහන්	රුපි	රුපි (2011)	රුපි (2011)	රුපි (2010)
දායකත්වය ප්‍රාග්ධන සහ සංචිත					
ප්‍රාග්ධන සහ සංචිත					
ජපන් රජයෙන් ලැබුණු ප්‍රධාන			978,976,227		978,976,227
ප්‍රාග්ධන සංචිත (ලැබුණු වෙනත් ප්‍රධාන)			37,848,935		37,848,935
ප්‍රාග්ධන සංචිත			2,280,000		2,280,000
				1,019,105,162	1,019,105,162
වාරික ආදායම් (ශ්‍රී ලංකා රජයෙන් ලත් ප්‍රධාන)				260,735,556	164,153,056
				1,279,840,718	1,183,258,218
ආදායම් හා වියදම් ගිණුම්				(847,707,652)	(825,455,067)
				432,133,066	357,803,151
				===========	===========
නියෝජනය කළේ :-					
ස්ථාවර වත්කම්					
දේපළ, යන්ත්‍ර උපකරණ	සටහන් 1		662,145,463		698,212,555
ලී බඩු සහ වෙනත්	සටහන් 1		142,173,240		105,426,334
			804,318,702	804,318,702	803,638,889
එකතු කළා ජංගම වත්කම්					
කෙටිකාලීන ආයෝජන	සටහන් 2	10,045,000			10,045,000
තොග	සටහන් 3	136,457,613			129,730,420
ණය ගැතියෝද තැන්පතු, කලින් ගෙවීම්	සටහන් 4	148,434,853			133,580,208
බැංකු සහ මුදල් ශේෂය	සටහන් 5	120,169,732	415,107,198		53,267,759
අඩු කළා : ජංගම බැරකම්					
ණයහිමියෝ සහ උපචිත ගෙවීම්	සටහන් 6		787,292,835	(372,185,637)	(772,459,125)
				432,133,066	357,803,151
				===========	==========

....

ගණකාධිකාරි   අධ්‍යක්ෂක   සභාපති

දිනය - 16.04.2011

ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන 2011 වර්ෂය සඳහා ආදායම් වාර්තාව

		2011 රු.	2010 රු.
ආදායම්	සටහන 7	1,689,268,276	1,620,030,213
වෙනත් මෙහෙයුම් වලින් ලද ආදායම් (පොලී)		4,443,027	3,333,679
		1,693,711,303	1,623,363,892
සැපයුම් ද්‍රව්‍ය සඳහා පිරිවැය	සටහන 8	516,694,280	451,767,411
සේවක වියදම්	සටහන 9	946,558,795	874,862,871
ක්ෂයවීම් සහ හිලව් කිරීම්	සටහන 10	(22,322,459)	6,700,817
වෙනත් මෙහෙයම් සඳහා වියදම්	සටහන 11	269,826,508	227,548,929
		1,710,757,123	1,560,880,028
අතිරික්ත සහ ක්ෂයවීම් මෙහෙයුම්වලින්		(17,045,820)	62,483,864
මුල්‍යමය පිරිවැය	සටහන 12	2,207,459	2,297,874
වෙනත් වියදම්	සටහන 13		
අතිරික්ත / ක්ෂයවීම් ආදායම් බදුවලට පෙර		(19,253,279)	60,185,990
ආදායම් බදු (Economic Service Charges & on interest)		8,642,497	8,121,211
		(27,895,776)	52,064,779
අතිරික්ත / ක්ෂයවීම් ආදායම් බදුවලට පසු			
ආදායම් සහ වියදම් ගිණුම ඉ /ගෙ ආවා	සටහන 14	(819,811,879)	(877,289,359)
ආදායම් සහ වියදම් ගිණුම ඉ /ගෙ ගියා		(847,707,655)	(825,224,580)

මුදල් ප්‍රවාහ වාර්තාව

දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂ සඳහා	2011	2010
ක්‍රියාකාරී කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ	රු.	රු.
ක්‍රියාකාරී කටයුතුවලින් ලත් මුදල් (සටහන් A)	(42,975,513)	9,847,335
පාරිතෝෂිත	(11,540,418)	(10,701,715)
ක්‍රියාකාරී කටයුතුවලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහ	(54,515,930)	(854,380)
ආයෝජන කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ		
පොලී ආදායම්	4,443,027	3,333,679
ප්‍රාග්ධන ප්‍රදාන (ලැබුණා)	236,785,000	115,000,000
දේපළ, යන්ත්‍ර සහ උපකරණ මිලට ගැනීම්	(119,810,123)	(86,097,294)
	66,901,974	31,382,005
මුදල් හා මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම්		
ජනවාරි 1 වන දිනට මුදල් හා මුදල් සමාන වත්කම්	53,267,759	21,885,754
දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන වත්කම් (සටහන් B)	120,169,732	53,267,759
	66,901,973	31,382,005
(සටහන් A)		
ක්‍රියාකාරී කටයුතුවලින් ඉපයූ මුදල්		
වර්ෂය සඳහා අතිරික්ත/ (හිඟය)	(27,895,776)	52,064,779
පෙර වර්ෂය සඳහා ගැලපීම්	5,643,188	7,332
ප්‍රාග්ධන ප්‍රදාන හිලව් කිරීම	`(140,202,500)	(113,654,017)
ක්ෂය වීම	119,130,311	120,354,834
පාරිතෝෂිත වෙන් කිරීම්	37,425,242	27,843,208
කල්පිරි අයිතම සඳහා වෙන් කිරීම්	1,351,858	
බොල්ණය සඳහා වෙන් කිරීම්		
ආයෝජන ආදායම් (පොලී)	(4,443,027)	(3,333,679)
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ඌණතාවය	(8,990,704)	83,282,457
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම සඳහා ගැලපීම		
(වැඩිවීම) / අඩුවීම - තොග	(8,079,049)	(15,259,399)
(වැඩිවීම) / අඩුවීම - ණයගැතියන්	(14,854,645)	(6,610,620)
(වැඩිවීම) / අඩුවීම - ණයහිමියන් හ ගෙවිය යුතු	(11,051,115)	(51,565,103)
	(42,975,513)	9,847,335
සටහන්		
මුදල් හා මුදල් හා සමාන වත්කම්වල විශ්ලේෂණය		
බැංකුවේ සහ අතැති මුදල්	120,169,879	53498,393
බැංකු අයිරාව	(147)	(147)
	120,169,732	53,498,246

ගිණුම් සඳහා සටහන්

සටහන් 1

ස්ථාවර වත්කම් (දේපල, යන්ත්‍ර, උපකරණ සහ ලී බඩු ආදිය)

	රෝහල් ඉඩම අක්කර 26	ගොඩැනිගිලි ජපන් රජයෙන් ලත් ආධාර	වෙනත් ගොඩනැගිලි	ජපන් රජයෙන් ලත් වෙනත් ප්‍රධාන	ලීබඩු, ගෑස් ලිප් හා වෙනත් භාණ්ඩ	වෛද්‍ය උපකරණ	වාහන	පරිගණක මෘදුකාංග	රෝහල් මුළුතැන්ගෙය ප්‍රතිසංස්කරණය	කෙරෙමින් පවතින වැඩ සඳහා ප්‍රාග්ධන	එකතුව 2011	එකතුව 2010
පිරිවැය/නෑ- වත තක්සේරු කිරීම												
ජනවාරි 1 වන දිනට	15,015,732	453,028,634	326,676,885	416,490,078	79,785,867	1,159,698,741	26,630,282	650,000	28,760,185	50,436,489	2,557,172,893	2,471,075,599
එකතු කිරීම			4,474,832		24,799,317	68,289,820	5,785,000	88,000		32,053,186	135,490,155	101,807,884
හුවමාරු කිරීම් / විකිණීම්										15,680,032	15,680,032	15,710,590
දෙසැ: 31 වන දිනට	**15,015,732**	**453,028,634**	**331,151,717**	**416,490,078**	**104,585,184**	**1,227,988,561**	**32,415,282**	**738,000**	**28,760,185**	**66,809,643**	**2,676,983,015**	**2,557,172,893**
ක්ෂයවීම												
ජනවාරි 1 වන දිනට		235,574,892	70,708,787	416,490,077	55,166,670	949,923,758	23,194,590	487,500	1,987,728		1,753,534,002	1,633,179,169
වර්ෂයට අදාළ ක්ෂය කිරීම් විකිණුම් සඳහා අය කිරීම්		9,060,573	7,275,138		5,660,592	92,496,034	3,037,455	162,500	1,438,019		119,130,311	120,354,834
		244,635,465	**77,983,925**	**416,490,077**	**60,827,262**	**1,042,419,792**	**26,232,045**	**650,000**	**3,425,747**		**1,872,664,313**	**1,753,534,003**
ශුද්ධ පොත් අගය												
ජන. 01 වන දිනට	15,015,732	217,453,742	255,968,098	1	24,619,197	209,774,983	3,435,692	162,500	26,772,457	50,436,489	803,638,891	837,896,430
දෙසැ. 31 වන දිනට	15,015,732	208,393,169	253,167,791	1	43,757,922	185,568,769	6,183,237	88,000	25,334,438	66,809,643	804,318,702	803,638,890

ගිණුම් සඳහා සටහන්

සටහන 2 - ආයෝජන

		2011	2010
		රු.	රු.
කෙටිකාලීන ආයෝජන - ඇමතුම් තැන්පතු ලංකා බැංකු - ඇමතුම් තැන්පතු		10,000,000	10,000,000
ජාතික ඉතිරි කිරීමේ බැංකුව (කාර්ය මණ්ඩල ආරක්ෂක තැන්පතු)		45,000	45,000
		10,045,000	10,045,000
		=========	=========

සටහන 3 - තොග

		2011	2010
පොදු ගබඩාව		8,960,896	12,334,297
ඖෂධ ගබඩාව		19,132,142	8,045,406
ශල්‍ය පරිභෝජන ගබඩාව		43,582,853	46,247,622
වෙලුම් (Dressing) ද්‍රව්‍ය ගබඩාව		7,659,845	8,103,020
විද්‍යුත් කාර්මික ඉංජිනේරු ගබඩාව (EME)		9,215,702	9,975,088
විකිරණ දෙපාර්තමේන්තු ගබඩාව		3,030,164	2,335,304
රෝග නිධාන රසායනාගාර සහ ලේ බැංකු ගබඩාව		2,691,774	2,404,993
පොදු අයිතම පොදු ගබඩාව		4,357,998	5,111,069
ඖෂධ හා ශල්‍ය පරිභෝජන උප ගබඩාව		39,893,687	35,889,213
		138,525,061	138,446,012
කල් ඉකුත් අයිතම සඳහා වෙන් කිරීම		2,067,450	715,592
		136,457,611	129,730,420
		=========	==========

සටහන 4 - ණයගැතියන් , තැන්පතු හා කලින් ගෙවීම්

		2011	2010
විවිධ තැන්පතු	උපලේඛණය 01	5,805,781	5,805,781
ලැබිය යුතු ආදායම්	උපලේඛණය 02	4,869,357	4,947,764
සේවක ආපදා ණය	උපලේඛණය 03	76,757,243	74,798,551
සේවක පාසල් පොත් අත්තිකාරම්		-	51,500
විශේෂ ණය - ගංවතුර ආපදා		28,875	
සේවක විශේෂ අත්තිකාරම්		-	5,800
සේවක වැටුප් අත්තිකාරම්	උපලේඛණය 04	84,999	59,190
සේවක උත්සව අත්තිකාරම්	උපලේඛණය 05	1,104,000	1,350,000
ප්‍රාදේශීය මිලදී ගැනීම්		-	20,221
විවිධ ණයගැතියන්	උපලේඛණය 06	8,596,193	12,307,317
අයවිය යුතු රෝහල් ගාස්තු	උපලේඛණය 07	46,064,648	28,710,327
සෞඛ්‍ය අමාත්‍යාංශ මළ ප්‍රවාහන වියදම් - හෙද විදුහල		5,907,011	5,907,011
මරණ පාරිතෝෂිත - ලැබිය යුතු		500,000	900,000
සායනික සමාජය		44,463	44,463
		149,762,570	134,907,925
අඩු කළා - බොල් ණය වෙන් කිරීම්		1,327,716	1,327,716
		148,434,853	133,580,209

ගිණුම් සඳහා සටහන්

සටහන 5 - බැංකු සහ මුදල් ශේෂ

	2011	20101
	රු.	රු.
ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව	93,615	93,615
ලංකා බැංකුව - ජංගම	103,658,056	28,957,847
ලංකා බැංකුව - ජංගම ගිණුම අංක 02	160,000	160,000
හැටන් නැෂනල් බැංකුව - 20 වන සංවත්සර ගිණුම	20	20
හැටන් නැෂනල් බැංකුව	1,274,578	11,683,613
හැටන් නැෂනල් බැංකුව ඇමතුම් තැන්පත් ගිණුම	11,126,000	11,200,000
ලංකා බැංකුව - කාන්දුකරණ අරමුදල් ජංගම ගිණුම	637,775	612,775
අතැති මුදල් සහ ආග්‍රිම ගිණුම	3,172,825	513,024
මුද්දර ගාස්තු සඳහා සුළු මුදල් ආග්‍රිමය	47,010	47,010
හැටන් නැෂනල් බැංකුව - කාන්දුකරණ අරමුදල් ජංගම ගිණුම	(147)	(147)
	120,169,732	53,267,757
	=========	=========

සටහන 6 - ජංගම බැරකම්

ණයගැතියන් සහ උපචිත වියදම්	460,041,692	468,261,068
වෙනත් බැරකම්	22,929,888	25,761,627
පාරිතෝෂිත සඳහා වෙන් කිරීම්	304,321,255	278,436,430
	787,292,835	772,459,125
	==========	==========

සටහන - 6 A

ව්‍යාපාර වස්තු අගය වෙනස්වීමේ වාර්තාව

ප්‍රාග්ධන ප්‍රදාන (Capital Grants)

		2011 රු.	2010 රු.
ව්‍යාපෘතිය සඳහා ජපන් රජයෙන් ශ්‍රී ලංකා රජය ලත් ප්‍රදාන		928,851,297	928,851,297
ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙන් ලත ප්‍රදාන		50,124,930	50,124,930
වාරික ආදායම් (ශ්‍රී ලංකා රජයේ ප්‍රාග්ධන ප්‍රදාන)	සටහන - C	260,735,556	164,153,056
ප්‍රාග්ධන සංචිත		2,280,000	2,280,000
හිමෝ ඩයලිසීස් යන්ත්‍රයක් මිලදී ගැනීමට ලත් පරිත්‍යාග		799,233	799,233
ජපානයේ කජීමා ආයතනයෙන් පරිත්‍යග කරන ලද මෝටර රථ සහ උපකරණ		260,000	260,000
ජපානයේ ඔලිම්පස් ආයතනයෙන් ලත් ප්‍රදාන		79,700	79,700
හෘද උරස් ඒකකය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලත් ප්‍රදාන		30,000,000	30,000,000
ජනාධිපති අරමුදලින් ලත් ප්‍රදාන		6,710,000	6,710,000
		1,279,840,216	1,183,258,216
		===========	===========

සටහන - C

වාරික ආදායම් (ශ්‍රී ලංකා රජයේ ප්‍රාග්ධන ප්‍රදාන)

ජනවාරි 1 වන දිනට ශේෂය	164,153,056	162,807,073
එකතු කළා :- වර්ෂය තුල ලත් ප්‍රාග්ධන ප්‍රදාන	236,785,000	115,000,000
අඩු කළා :- ප්‍රාග්ධන ප්‍රදාන හිලව් කිරීම	140,202,500	113,654,017
දෙසැම්බර් 31 දිනට ශේෂය	260,735,556	164,153,056
	========	==========

ණයගැතියන් සහ උපචිත වියදම්

		2011	2010
උපචිත වියදම්	උපලේඛන 11	70,358,186	67408,624
විගණන දෙපාර්තමේන්තුව		2,282,901	1,732,901
ණයගැතියන් (වෙළඳ)	උපලේඛන 12	38,238,377	44,386,328
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය		26,045,734	28,745,734
වෛද්‍ය සැපයුම් අංශය		323,116,494	322,368,518
රාජ්‍ය ඔසුසල		-	3,618,964
		460,041,692	468,261,069

ශ්‍රී ජයවර්ධනපුර රෝහල

දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂයේ ආදායම් වාර්තා සඳහා සටහන්

සටහන් 7 - ආදායම්

		2011	2010
	රු	රු	
රෝගී සත්කාර වෙනුවෙන් ලද ආදායම්		828,235,820	812,121,169
රජයෙන් ලත් පුනරාවර්තන ප්‍රදාන		837,000,000	775,000,000
වෙනත් ආදායම්	සටහන A	24,032,457	32,909,044
		1,689,268,276	1,620,030,213
		==========	==========

සටහන A - වෙනත් ආදායම්

	2011	2010
ගිලන් රථ ගාස්තු	930,691	1,118,230
රෝගීන් බලා ගන්නන් / අමුත්තන්	1,752,333	2,030,747
සේවක ආහාර ආදායම්	755,485	796,399
සේවක කුලිය හා විදුලි ආදායම්	1,975,676	2,148,333
රෝහල් ආපනශාලා - කුලිය	960,000	870,000
රෝහල් ආපනශාලා - විදුලි	463,212	236,294
රෝහල් බැංකු - කුලිය	240,000	240,000
රෝහල් බැංකු - විදුලි	334,750	251,153
සණස - කුලිය	12,000	12,000
ලංකා බැංකුව - විදුලි	287,583	317,137
විවිධ ආදායම්	4,936,696	7,096,923
කාර්‍ය මණ්ඩලය විසින් පියවූ ඇපකර	1,307,012	7,875,997
විකුණුම් කොමිස්	293,918	190,127
චැනල් ගාස්තු	1,261,635	2,254,077
ආරක්ෂක සේවා - විදුලිය	46,724	41,430
කිරිහල - විදුලිය	94,943	51,978
කිරිහල - කුලිය	60,000	60,000
ඔසුසල - කුලිය	1,020,000	1,020,000
මහජන බැංකුව - විදුලිය	38,745	40,164
සේවා ගාස්තු 0.1%	241,455	275,626
රථ ගාලෙන් ලද ආදායම	6,939,600	5,982,430
චිලර් යන්ත්‍ර (Chiller Machines) විකිණීමෙන් ලත් ආදායම	80,000	
	24,032,457	32,909,045

සටහන - 8 ද්‍රව්‍ය මිලදී ගැනීම

	2011	2010
ඖෂධ	145,933,419	102,107,630
ශල්‍යකර්ම ද්‍රව්‍ය	113,811,713	124,743,878
වෙළුම් ද්‍රව්‍ය	29,953,779	44,421,981
වෛද්‍ය ඔක්සිජන්	16,751,482	16,906,108
රසායනාගාරයේ රසායනික හා පාරිභෝජන ද්‍රව්‍ය	84,752,413	57,701,448
විකිරණ පටල හා රසායනික ද්‍රව්‍ය	15,676,968	13,570,902
පොදු සැපයුම්	34,852,531	33,727,472
විද්‍යුත් වෛද්‍ය ඉංජිනේරු (පාරිභෝජන ද්‍රව්‍ය)	5,112,393	5,806,657
	446,844,697	398,986,076
එකතු කළා : තොග ඉදිරියට ගෙන ඒම	130,445,990	117,959,210
අඩු කළා : තොග ඉදිරියට ගෙන යාම	138,525,061	130,446,011
	438,765,627	386,499,275
එකතු කළා : භාවිතයට ගත නොහැකි සහ කල් ඉකුත් වූ තොග (වෙන් කිරීම)	1,351,858	2,772,598
එකතු කළා : රෝගීන්ගේ හා සේවකයින්ගේ ආහාර ද්‍රව්‍ය සඳහා	76,576,796	68,040,732
	516,694,280	451,767,409

❖ අතිරික්ත වෙන් කිරීම් සඳහා ගැලපීම් වරහන් තුල දැක්

	2011	2010
සටහන 9 - සේවකයින් සඳහා වැයවන වියදම්		
a) වැටුප් හා වේතන		
	රු.	රු.
වැටුප් හා දීමනා	639,147,429	584,767,951
සේවා අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාර අරමුදල්	88,884,506	85,864,762
අතිකාල, අන්තර් රාජකාරී හා අතිරේක රාජකාරී දීමනා	135,346,871	135,291,137
නිලඇඳුම් දීමනා	5,420,458	4,968,561
නොගන්නා ලද නිවාඩු සඳහා ගෙවීම්	5,000,000	5,000,000
විශ්‍රාම වැටුප් සඳහා ගෙවීම්	3,857,860	3,185,649
ගමන් වියදම් සඳහා	567,222	783,179
	878,224,345	819,861,239
එකතු කළා :සේවකයන් සඳහා වැයවන වෙනත් වියදම්		
නොමිලේ කරන වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැයවන වියදම්	30,271,123	26,794,371
සේවක සුබසාධක	394,965	-
මානව සම්පත් සංවර්ධනය සඳහා වියදම්	243,120	364,053
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	37,425,242	27,843,208
	946,558,795	874,862,871
සටහන 10 - ක්ෂයවීම හා හිලව් කිරීම		
වර්ෂය තුල ක්ෂයවීම වෙනුවෙන් වෙන් කිරීම්	117,880,041	120,354,834
අඩු කළා : හිලව් කිරීම්	140,202,500	113,654,017
	- 22,322,459	6,700,817
සටහන 11 - වෙනත් වැයවන වියදම්		
a) ඉන්ධන		
විදුලි ජනක	910,163	204,400
ඉන්සිනරේටර්	-	
බොයිලේරු	7,324,100	4,844,400
මෝටර් රථ වාහන	3,314,277	3,140,578
	11,548,540	8,189,378
b) උපයෝගිතා සේවා		
විදුලි ගාස්තු	101,413,052	91,907,884
ජල ගාස්තු	25,029,363	23,277,456
දුරකථන ගාස්තු (සන්නිවේදන)	2,754,178	3,025,973
	129,196,593	118,211,313
c) අලුත්වැඩියා කිරීම් හා නඩත්තු		
සැපයුම්කරුවන් සමඟ කරන ලද සේවා ගිවිසුම්	19,387,743	9,388,314
මෝටර් රථ වාහන අළුත්වැඩියාවන්	2,126,190	1,653,852
වෛද්‍ය උපකරණ අළුත්වැඩියාවන්	34,419,223	17,355,976
වාහේ ගෘහ භාණ්ඩ අළුත්වැඩියාවන්	-	26,020
ගොඩනැගිලි අළුත්වැඩියාවන්	4,273,672	4,374,030
	60,206,829	32,798,191
d) වෙනත් සේවා		
පිරිසිදු කිරීමේ සේවා	22,773,365	22,253,228
අපද්‍රව්‍ය බැහැර කිරීමෙ සේවා	1,447,798	1,492,680
හිමිකරුවන් නොමැති මළ සිරුරු ඉවත් කිරීම	400,250	364,100
අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාණු නඩත්තු කිරීම	9,849,021	11,875,740
රෙදි ඇපිල්ලීමේ (ලෝන්ඩ්‍රි) සේවය	6,229,776	4,792,257
ආරක්ෂක සේවා	15,060,531	13,877,462
බලපත්‍ර හා රක්ෂණ	615,360	387,647
නීති ගාස්තු	829,298	363,144
විගණන ගාස්තු	550,000	550,000
විනය පරිපාටි වියදම්	-	342,260
තැපැල් හා මුද්දර ගාස්තු	643,081	598,301
සංග්‍රහ කිරීමේ වියදම්	665	11,500
මණ්ඩලයේ / ටෙන්ඩර් මණ්ඩලයේ සාමාජිකයන්ට දීමනා	259,750	127,984
කපාහරින ලද රෝහල් ගාස්තු (පූජ්‍ය පක්ෂය)	5,298,042	6,269,719
පුවත්පත් දැන්වීම්	2,219,408	1,435,124
පොත්පත් සහ සඟරා	896,878	1,008,273
විවිධ වියදම්	965,102	1,683,407
වරිපනම් හා බදු	836,220	917,220
	68,874,54	68,350,046
	269,826,508	227,548,929

		2011	2010
		රු.	රු.
සටහන 12 -	**මූල්‍යමය වියදම්**		
	බැංකු ගාස්තු	413,200	724,869
	ණය කාඩ්පත් සඳහා කොමිස්	1,794,259	1,573,005
		2,207,459	2,297,874
සටහන 13 -	**වෙනත් වියදම්**		
	බොල්ණය සඳහා ඉවත් කිරීම්	-	-
	අඩමාන ණය සඳහා වෙන් කිරීම්	-	-
	ස්ථිර වත්කම් විකිණීම (පාඩු)	-	-
	කලින් ගෙවීම් වෙනුවෙන් ඉවත් කිරීම්	-	-
	ආපදා ණය වෙනුවෙන් ඉවත් කිරීම්	-	-
		-	-
සටහන 14 -	**රෝහල් අරමුදල වෙන් නොකළ ශේෂය**		
	ආදායම් හා වියදම් ගිණුම අනුව අතිරික්තය / හිඟය	(27,895,776)	52,064,779
	ජනවාරි 01 වන දිනට ආදායම් හා වියදම් ගිණුම	(825,455,067)	(877,527,178)
	පෙර වර්ෂය සඳහා ගැලපුම	5,643,188	7,332
	දෙසැම්බර් 31 වන දිනට ආදායම් හා වියදම් ගිණුම	(819,811,879)	(877,519,846)
	වර්ෂය අවසානයේ ආදායමට වඩා වියදම් අතිරික්තය	(847,707,655)	(825,455,067)

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - 2011

01. සාමාන්‍ය

01. සාමාන්‍ය

1.1 සකස් කිරීමේ පදනම

1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, මණ්ඩලීය ශේෂපත්‍ර, ආදායම් වාර්තා, ව්‍යාපාර වස්තු අගය වෙනස් කිරීම හා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මණ්ඩලීය සටහන් සකස් කර ඇත.

2. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය ප්‍රමිතියට අනුව සකස් කෙරේ.

3. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලාංකීය රුපියල්වලින් දැක්වේ.

1.2 රජයේ ප්‍රදාන

මණ්ඩලයට පහත සඳහන් රජයේ ප්‍රදාන ලැබී ඇත.
ප්‍රාග්ධන ප්‍රදාන - මහා භාණ්ඩාගාරයෙන්
පුනරාවර්තන ප්‍රදාන - මහා භාණ්ඩාගාරයෙන්

1. ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වෙත රජයේ ප්‍රාග්ධන ලැබුණු විට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නොමැති අවස්ථාවල, ප්‍රදාන ප්‍රතිපාදන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ඡේද 26 මණ්ඩලය විසින් අනුගමනය කර ඇත.

මේ අනුව ආදායම් ගිණුමකට, ප්‍රාග්ධන ප්‍රදාන කොටස් වශයෙන් බැර කරන ලදුව, අවුරුද්දකට 25% බැගින් ක්‍රමක්ෂය (Amortization) කෙරේ. ණය ක්‍රමක්ෂය වූ අනුපාතය, 1997 සිට 2006 දක්වා වූ කාලය තුල වත්කම් සඳහා වූ ආයෝජනය මත ගණනය කරන ලද හරිත (බර තැබූ) සාමාන්‍ය ක්ෂය (weighted average depreciation) අනුපාතයට දළ වශයෙන් සමානය.

2. මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදානයන් යම් කාල පරිච්ඡේදයක් තුල ලැබුණු ආදායම ලෙස සලකනු ලබන අතර, වසරේ ආදායම ගිණුමට බැර කර ඇත.

1.3 බදුකරණය

ආදායම් බදු සඳහා වෙන් කිරීම්, මූල්‍යම වාර්තාවල සඳහන් ආදායම් හා වියදම් පිළිබඳ කරුණු පදනම් කර ගනිමින්, 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කර ඇත. කෙසේ වෙනත්, ඉදිරියට ගෙන ආ බදු අඩුවීම් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නැත. ආර්ථික සේවා අයකිරීම් (ESC) වශයෙන් රු. 764,328.00 ක් ගිණුම්වල වෙන් කර ඇත.

පොලී ආදායම් මත ආදායම් බදු ගිණුම්වල දක්වා නැත. එබැවින් ආර්ථික සේවා අයකිරීම්වලින් ආදායම් බද්ද අවකරණය කළ හැකිය.

1.4 තුලනාත්මක තොරතුරු

ගිණුම්කරන ප්‍රතිපත්ති, මණ්ඩලය විසින් අනුරූපීව අදාළ කරගනු ලබන අතර, ඉකුත් වසරේ ගිණුම්වලටද මෙය අදාළ කරගන්නා ලදී.

සියළුම ගැලපීම් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත.

සියළුම මුදා හරින ලද රෝහල් බිල්පත් රෝහලේ ආදායම් ලෙස සලසා ආදායම් වාර්තාවේ වියදම් වශයෙන් දක්වා ඇත.

02. වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

2.1. දේපළ, යන්ත්‍රෝපකරණ, ක්ෂවීම හා නැවත තක්සේරු කිරීම

1. දේපළ, හා යන්ත්‍රෝපකරණවල අගය, ඒවායේ ඒවා ගත් මිලෙන් හෝ ඒවායේ තක්සේරු වටිනාකමින් සමුච්චිත ක්ෂය අඩු කරමින් ගණනය කර ඇත.

දේපළ, යන්ත්‍ර හා උපකරණවල අගය වන්නේ, ඒවායේ අපේක්ෂිත ප්‍රයෝජනය සඳහා ඒවා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම දක්වා වූ අනුසංගික වියදම්ද ඇතුලත්ව එම වත්කම් මිලදී ගත් අගය හෝ ඉදිරිපත් කළ අගයයි.

සපයනු ලබන සේවය පවත්වාගෙන යාමට හෝ එහි ධාරිතාවය වැඩි කර ගැනීමට, ස්ථිර ගණයේ වත්කම් අත්කර ගැනීම්, පුළුල් කිරීම් හෝ වැඩිදියුණු කිරීම් සඳහා වැයවන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකා ඇත.

2. භිස් ඉඩම් හැර අනිත් වත්කම් සඳහා ක්ෂය වීම්, සරල මාර්ග ක්‍රම භාවිතා කරමින් පහත සඳහන් අනුපාතයට වෙන් කර ඇත.

<u>ජපාන රජයේ පරිත්‍යාග</u>

ගොඩනැගිලි	02%
විදුලි වැඩ	10%
අපද්‍රව්‍ය ජල ප්‍රවාහන හා ජලනල පද්ධති	10%
වායු සමීකරණ	15%
සෝපාන	10%
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	13%
වෛද්‍ය උපකර	20%
<u>වෙනත් වත්කම්</u>	
අනෙකුත් ගොඩනැගිලි	05%
ගෘහ භාණ්ඩ, සවිකිරීම්, ගෑස් උඳුන් සහ වෙනත් උපකරණ	20%
විදුලි උපකරණ, මහන මැෂින් සහ සිලින්ඩර	10%
වෛද්‍ය උපකරණ සහ මෙවලම්	25%
ශීතකරණ සහ ඡායා පියපත් යන්ත්‍ර	15%
රථවාහන	20%
මෘදුකාංග (දේශීයව සකසන ලද)	100%

3. මිලදී ගත් වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදන වෙන් කර නොමැති අතර, ඉවත් කරන වර්ෂයේ සම්පූර්ණ ක්ෂය ප්‍රතිපාදන වෙන් කර ඇත.

4. මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා මුදල් හා මුදල්වලට සමාන දේවල් යටතට අතැති මුදල් සහ බැංකු අයිරා ශේෂයන්ද ඇතුලත් වේ. මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ වක්‍රාකාර ක්‍රමය පදනම් කර ගෙනය.

03. වගකීම් හා වෙන් කිරීම්

3.1 ප්‍රාග්ධන බැඳීම් සහ ආපතිකතාවයන්

ශේෂ පත්‍ර දිනට ඇති සියලුම භෞතික ප්‍රාග්ධන වියදම් සඳහා අසම්භාව්‍ය වගකීම් ගිණුම්වලට අදාළ සටහන්වල පෙන්වා ඇත.

3.2 විශ්‍රාම ප්‍රතිලාභ වැය

විශ්‍රාමික දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් සේවය කර ඇති සේවකයින්ට පමණක් පාරිතෝෂික වෙන් කිරීම් කර ඇත.

3.3 කල් ඉකුත් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය සහ බොල් ණය සඳහා වෙන් කිරීම්

වර්ෂය තුල කල් ඉකුත්වූ ඖෂධවල නියම වටිනාකම කල් ඉකුත්වන භාණ්ඩ සඳහා වූ වෙන් කිරීමක් ලෙස ගණන් ගෙන එහි වෙනස, ආදායම් හා වියදම් ප්‍රකාශයේ ගැලපුම් කර ඇත.

3.4 ඉන්වෙන්ටරි තක්සේරුව

ඉන්වෙන්ටරිවල සඳහන් භාණ්ඩවල ශුද්ධ වටිනාකම වෙළඳපොල මිල හා සමාන බවට අනුමාන කරමින්, එම මිලට වඩා අඩු මිලක් වන සාමාන්‍ය පිරිවැයට එම භාණ්ඩ තක්සේරු කර ඇත.

04. ආදායම් හා වියදම් ගිණුම

4.1 ආදායම්

1. මණ්ඩලයේ ආදායම රෝහල් ගාස්තු වශයෙන් ලැබෙන ආදායමින්, රජයේ පුනරාවර්තන ප්‍රදානවලින්ද, ඇමතුම් තැන්පතුවලින් හා සේවකයින්ට දෙන ණය වලින් ලැබෙන පොලී ආදායමින්ද, වෙනත් විවිධ ආදායම්වලින් සමන්විතය.

2. සියලුම ආදායම් උපචිත පදනම මත හඳුනා ගෙන ඇත.

4.2 වියදම්

1. රෝගී සත්කාර සේවා සැපයීමට දරණ ලද සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට දරණ ලද සියලු වියදම් වර්ෂයේ අතිරික්තය හෝ ඌණතාවය ලබා ගැනීම පිණිස උපචිත පදනම මත ආදායමට ආරෝපිත කර ඇත.

2. ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සඳහා මණ්ඩලීය කාර්ය සාධනයන් මැනවින් පෙන්නුම් කිරීමට වියදම්වල ස්වභාවය දක්වන ක්‍රමය මගින් හොඳාකාරව හැකි බව මණ්ඩලයේ මතය බැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කර ඇත.

3. වෘත්තිමය ගාස්තු වශයෙන් වර්ෂය තුල එකතු වූ රුපියල් මිලියන 160 ක මුදල මණ්ඩලය විසින් උපයාගත් හෝ ලබාගත් මුදලක් නොවන බැවින් ගිණුම්වලට ඇතුලත් කර නොමැත. මෙම වෘත්තීමය ගාස්තු, මණ්ඩලයේ යම් විශේෂිත සේවකයන් විසින් තමන්ගේ සාමාන්‍ය රාජකාරී වේලාවන්ට පරිබාහිරව හා නිවාඩු දිනවල පුද්ගලිකව සපයන ලද සේවාවන් වෙනුවෙන් උපයාගත් වෘත්තීමය ගාස්තු වීම මෙයට හේතුවයි. මෙම වෘත්තිමය ගාස්තුවලින් රුපියල් මිලියන 1.8 ක මුදලක් රෝහල් මණ්ඩලය විසින් අඩුකර රඳවා ගැනීමේ බදු වශයෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல My No	එච්ඩබ්ලිව්/බී/එස්ජේජ්එච්/ එෆ්ඒ/2011/	ඔබේ අංකය உமது இல No.		දිනය திகதி Date	2012 ජුලි 31 දින.

සභාපති,
ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය.

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලා මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩල පනතේ 12 වන වගන්තියේ 3 උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) සී වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2012 ජුනි 01 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අදහස් සහ හෙළිදරව් කිරීම වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය වටිනාකම රු. 117,880,041 ක් ව තිබුණද, ක්‍රමක්ෂය ලෙස රු. 140,202,500 ක් ගිණුම්ගත කර තිබූ හෙයින් රු. 22,322,459 ක් වර්ෂයේ ඌනතාවය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2009 වර්ෂයේදී රෝහල වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ගිලන් රථ 2 ක වටිනාකම රු. 5,785,000 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

i. වාහනවල වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් එම අගයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය වැඩියෙන් දක්වා තිබූ අතර ඒ මත වූ ක්‍රමක්ෂය වටිනාකම රු. 1,446,250 කින් වැඩියෙන් දැක්වීම නිසා වර්ෂයේ ඌනතාවයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ii. ඉකුත් වර්ෂය සඳහා රු. 1,157,000 ක් වූ වාර්ෂික ක්ෂය ගණනය කර ගිණුම් ගත නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙනා ඌනතාවයද, සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ඌනතාවයද රු. 1,157,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

iii. මෙම පරිත්‍යාග වටිනාකමද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලාඒමක් සහ මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

(ඇ) අනෙකුත් ගොඩනැගිලිවල ක්ෂය වටිනාකම ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි රු. 93,270 ක් අඩුවෙන් දැක්වීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ ඌනතාවය අඩුවෙන් දැක්වුණි.

(ඈ) පරිත්‍යාග ලෙස ලැබුණු වත්කම්වලින් වාහන හැර අනෙකුත් වත්කම් ගිණුම්ගත කර නොතිබූ අතර ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් පරිත්‍යාග වශයෙන් ලද රු.2800,000 ක් වටිනා ස්නායු උත්තේජක නියාමකය (Nerve Stimulator Monitor) දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය වියදම වූ රු.700,000 ක්ද අඩුවෙන් සටහන් වීම හේතුවෙන් ඒ හා සමාන ප්‍රමාණයෙන් වර්ෂයේ ඌනතාවයද අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල රෝහල් සේවයෙන් ඉවත්ව ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 11 දෙනෙක් සඳහා ගෙවා නොතිබුණු පාර්තෝෂික මුදල රු. 2,458,721 ක් වන අතර එම මුදල් ගෙවිය යුතු පාර්තෝෂික ගිණුමකට මාරු කර නොතිබුණි.

(ඊ) වර්ෂ 6 සිට 26 දක්වා කාල පරාසයක් සේවය කල නිලධාරීන් 07 දෙනෙකුගේ සේවය තාවකාලිකව නතර කර තිබී, 2011 වර්ෂයේදී නැවත සේවයේ පිහිටුවා, මුළු සේවා කාලයටම සමාලෝචිත වර්ෂයේ පාර්තෝෂික දීමනා වෙන් කිරීම හේතුවෙන් වර්ෂයේ පාර්තෝෂික ප්‍රතිපාදනය රු. 1,357,488 කින් වැඩි වී තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ඌනතාවයද සමාන අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ආදායමට අනුව ආර්ථික සේවා ගාස්තුව රු. 8,522,683 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම වියදම රු. 8,642,497 ක් දැක්වීම හේතුවෙන් ආර්ථික සේවා ගාස්තු වියදම හා වර්ෂයේ ඌනතාවය රු. 119,815 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) එකතු කල අගය මත වූ රඳවා ගැනීම් බදු ලෙස වැඩිපුර අඩුකරගෙන තිබුණු රු. 320,905 ක මුදල නිවැරදි කිරීමේදී අදාල සැපයුම්කරුගේ ගිණුමට බැර කිරීම වෙනුවට අදාල වියදම් ගිණුම් බැර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ඌනතාවය ඒ හා සමාන ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(එ) රෝහලට පරිත්‍යාග ලෙස ලැබුණු රු. 290,000 ක මුදලකින් වෛද්‍ය උපකරණ මිලදී ගැනීමක් සිදු කර තිබුණු අතර ඊට අදාල ද්විත්ව සටහන් නිවැරදිව දක්වා තිබියදී නැවත වරක් ජනල් සටහනක් මගින් පරිත්‍යාග ගිණුම හර කර තොග ගැණුම් ගිණුම බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා පරිත්‍යාග වටිනාකම රු. 290,000 කින් අඩුවෙන් දැක්වුණි.

(ඒ) වර්ෂයට අදාල කල් ඉකුත් වූ තොගයේ වටිනාකම රු. 2,067,450 ක් වූ අතර එය තොග හානි ලෙස වර්ෂයේ ලාභයෙන් ලියා නොහැර ඉකුත් වර්ෂයේ කල් ඉකුත් වූ තොග ප්‍රතිපාදන ශේෂයට හිලව් කර රු. 1,351,858 ක වෙනස පමණක් වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට මාරු කිරීම නිසා රු. 715,592 ක් වර්ෂයේ ඌනතාවය අඩුවෙන් දැක්වුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසස් කන්තුක මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ තුන්වන මහලේ ඉදි කිරීම් කටයුතු අවසන් කර භාවිතයට ගෙන තිබුණද ඒ සඳහා වැය වූ රු. 28,010,153 ක මුදල කෙර්ගෙන යන වැඩ ගිණුමෙන් අනෙකුත් ගොඩනැගිලි ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2. නොසැසඳූ පාලන ගිණුම්

පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

ගිණුම් විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	ඉදිරිපත් කර තිබූ උපලේඛන/ ලේඛන අනුව ශේෂය	වෙනස
	රු.	රු.	රු.
i. සේවක ආපදා ණය	76,757,243	76,841,942	84,699
ii. ලැබිය යුතු රෝහල් ගාස්තු	46,064,648	46,905,016	840,368

2.2.3. ලැබිය යුතු යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) විවිධ ආයතනවලින් කුලී ආදායම්, විදුලි බිල්පත්, මලාපවාහන ගාස්තු හා රෝහල් ගාස්තු වශයෙන් වර්ෂ 9 කට වැඩි කාලයක සිට රු. 130,332 ක් හා වර්ෂ 1 ත් 4 ත් අතර කාලයක සිට ලැබිය යුතුව තිබූ රු. 7,248,583 ක් මේ වන විටත් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) රෝහල් ආපනශාලාවෙන්, ජනාධිපති අරමුදලින් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වර්ෂ 5 කට වැඩි කාලයක සිට ලැබිය යුතු රු. 1,117,561 ක් සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත ලාභයට කපාහැර තිබුණද අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) රෝහල විසින් විවිධ ණයහිමියන් සහ විවිධ ආයතන වෙත වර්ෂ 05 කට වැඩි කාලයක සිට ගෙවිය යුතු වූ රු. 178,144,248 ක ශේෂ 03 ක්ද වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක සිට ගෙවිය යුතුව තිබූ රු.148,445,693 ක ශේෂ 02 ක්ද නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

ගිණුම් විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොවූ සාක්ෂි
i. විවිධ ණයගැතියෝ	8,596,193	ශේෂ සනාථන
ii. අයවිය යුතු රෝහල් ගාස්තු	46,064,648	එම
iii. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අය විය යුතු හෙදි පුහුණු මධ්‍යස්ථාන මලාපවාහන ගාස්තු	5,907,011	එම
iv. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවිය යුතු මුදල්	26,045,734	එම
v. වෛද්‍ය සැපයුම් අංශයට ගෙවිය යුතු මුදල්	323,116,494	එම
vi. වෙළඳ ණයහිමියෝ	38,238,377	* රු. 10,446,000ක වටිනාකමට අදාල උපලේඛන * රු. 36,030,515 කට අදාල ශේෂ සනාථන

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමණාකාරීත්ව තීරණවලට අනුකුල නොවීම්

පහත සඳහන් අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව	අනුකුල නොවීම්
(අ) ආයතන සංග්‍රහය	
ix පරිච්ඡේදය 2.2 වගන්තිය	කාර්යාල වේලාවෙන් බාහිරව කරනු ලබන කාර්යාලීය නොවන වැඩ වෙනුවෙන් ලැබෙන ගාස්තුවෙන් 10%ක් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල වෛද්‍යවරුන්ට ගෙවා තිබූ රු.160,970,070ක්වූ වෘත්තීය ගාස්තු වලින් 10% ක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම් කර නොතිබුණි.
(ආ) මුදල් රෙගුලාසි	
i. මු.රෙ. 104(3) සහ (4)	2010 සහ 2011 වර්ෂවලදී සිදුවූ අනතුරු 2 ක් වෙනුවෙන් ප්‍රාරම්භක වාර්තා සහ පූර්ණ වාර්තා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ii. මු.රෙ. 371 (2)(ඇ)	i. මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 78 කදී රු. 1,191,600 ක අත්තිකාරම් ලබාදී තිබුණි. ii.අතුරු අග්‍රිමයන්, ලද කාර්ය නිම කල විගසම පියවිය යුතු වුවත් එසේ සිදු නොකරන ලද අවස්ථා 11 කට අදාලව දී තිබුණ මුදල රු.111,020 ක් විය.
iii. මු.රෙ. 762	තොග මට්ටම් නිශ්චය කර නොතිබුණි.
iv. මු.රෙ. 1645(අ)	වාහන බාර නිලධාරියා විසින් ලොග් පොත්හි අදාල සටහන් ලියා යාවත්කාලීන කර නොතිබුණි.
v. මු.රෙ. 1647 (අ)	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.
vi. මු.රෙ. 1647 (ඉ)	වාහන ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඈ) ඖෂධ කළමනාකරණ අත්පොතෙහි 6 පරිච්ඡේදයේ 2 සහ 7 වගන්ති	ඖෂධ නාමය හා මිල ගණන් සැලකිල්ලට ගෙන ඖෂධ නියම කලයුතු වුවද ඊට පටහැනිව ඖෂධයන්හි වෙළඳ නාමය පදනම් කරගෙන ඖෂධ නියම කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මුල් මාස 06 ට අදාලව රෝගීන්ට වැඩිපුර ගෙවීමට සිදු වූ මුදල රු. 17,038,325 ක් විය.
(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.8.2 වගන්තිය	භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කොර්යානු වෛද්‍ය පරීක්ෂණ කටයුතු සඳහා රෝහල වෙත යොමු කරන සේවා ලාභීන්ගේ පරීක්ෂණ කටයුතු වෙනුවෙන් නිලධාරීන් සඳහා රු. 796,648 ක දීමනාවක් ගෙවා තිබුණි.
(ඉ) 2006 ජනවාරි 25 දිනැති අංකNPA 8 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.8.4 වගන්තිය	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවට රේඛීය අමාත්‍යාංශයේ ඒ පිළිබඳ දැනුමක් ඇති නිලධාරියෙක් හෝ ආයතනයට බාහිර වූ පුද්ගලයෙක් සම්බන්ධ විය යුතු වුවද රෝහලේ රු. 24,900,000 ක් වටිනාකමැති වෛද්‍ය උපකරණ සහ යන්ත්‍ර 06 ක් මිලදී ගැනීමේදී එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

(ඊ) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 හා1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය.	නිල වාහන පාවිච්චි කිරීමට හිමිකම් නොමැති රෝහල් ලේකම් සහ රෝහල් නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත රු. 30,000 බැගින් මාසික ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු. 360,000 ක් සහ රු. 210,000 ක් වශයෙන් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.
(උ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව මසකට රු. 60,000 බැගින් මාස 08 කට රු. 480,000 ක දීමනාවක් අධ්‍යක්ෂකට ගෙවා තිබූ අතර විගණන විමසුමෙන් පසුව එකී දීමනාව ගෙවීම නතර කර තිබුණි.
(ඌ) 2009 ජුලි 08 දිනැති අංක PED/PU දරන රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ ලිපිය	බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටි සකස් කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත 2009 ජුලි 30 දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.
(එ) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඩීඑම්ඒ/2009 (2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය	ඉදිරිපත් කර තිබූ ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.
(ඒ) 2009 මැයි 29 දිනැති අංක1-18/2009 දරන සෞඛ්‍ය අමාත්‍යංශ පොදු චක්‍රලේඛය	එක් දිනක් සඳහා උපරිම වශයෙන් පැය 04 ක් පමණක් වෛද්‍යවරුන්ට හදිසි කැඳවීම් දීමනා ලබා ගත හැකි වුවද ඊට පටහැනිව දිනකට පැය 8 බැගින් 2011 මැයි සිට අගෝස්තු දක්වා වූ කාල සීමාවට අදාලව රෝහල් අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත පිලිවෙලින් රු. 172,800 ක් සහ රු.122,400 බැගින් හදිසි කැඳවුම් දීමනා ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රෝහල් මණ්ඩලයේ මෙහෙයුම්වලින් රු. 27,895,776 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය 52,064,779 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු. 79,960,555 කින් පිරිහී තිබුණි. එම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම මුළු අදායම රු. මිලියන 69 කින් වැඩි වීමට සාපේක්ෂව මුළු ද්‍රව්‍ය පාරිභෝජන වියදම රු. මිලියන 64 කින්ද, කාර්ය මණ්ඩල පිරිවැය රු. මිලියන 71 කින්ද අනෙකුත් මෙහෙයුම් වියදම් රු. මිලියන 42 කින් වැඩිවීම බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල සහ මූලය තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ විග්‍රහාත්මකව සසඳා පහත දැක්වේ.

අයිතමය	2011 වර්ෂයේ වටිනාකම	2010 වර්ෂයේ වටිනාකම	විචලනය	විචලනයේ ප්‍රතිශතය
	රු.	රු.	රු.	%
ඖෂධ ගබඩා තොග	19,132,142	8,045,406	11,086,736	137.8
විවිධ ණයගැතියෝ	8,596,193	12,307,317	(3,711,124)	(30)
අයවිය යුතු රෝහල් ගාස්තු	46,064,648	28,710,327	17,354,321	60
බැංකු ජංගම ගිණුම	103,658,056	28,957,847	74,700,209	257.9
ගෙවිය යුතු විගණන ගාස්තු	2,282,901	1,732,901	550,000	31.7
<u>ආදායම්</u>				
විවිධ ආදායම්	4,936,696	7,096,923	(2,160,227)	(30)
වැනල් ගාස්තු	1,261,635	2,254,077	(992,442)	(44)
<u>වියදම්</u>				
ඖෂධ මිලදී ගැනුම්	145,933,419	102,107,630	43,825,789	43
වෙළුම් ද්‍රව්‍ය ගැනුම්	29,953,779	44,421,981	(14,468,202)	(32)
රසායනාගාර පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගැනුම්	84,752,413	57,701,448	27,050,965	46.8
ඉන්ධන ගාස්තු	11,548,540	8,189,378	3,359,162	41
අළුත්වැඩියා සහ නඩත්තු වියදම්	60,206,829	32,798,192	27,408,637	83.6

3.3. කාරක ප්‍රාග්ධන කළමණාකරණය

ද්‍රවශීලතා අනුපාත	සම්මත අනුපාතය	2011	2010	2009
ජංගම අනුපාතය	2:1	1 : 1.9	1 : 2.4	1 : 2.9
ක්ෂණික අනුපාතය	1:1	1 : 2.8	1 : 3.9	1 : 5

ද්‍රවශීලතා අනුපාත වල පහල අගයන් නිරූපනය වන අතර රෝහලේ බැරකම් නිරවුල් කිරීමට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති තත්ත්වයක් නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්යසාධනය

මහාරෝගාශාලා මණ්ඩලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කාර්ය සාධන මිණුම් දඬු	2011	2010	අඩුවීම	2010 ට සාපේක්ෂව 2011හි ප්‍රතිශතය %
i. ස්නායු ශල්‍යකර්ම සංඛ්‍යාව	67	194	127	65.5
ii. උගුර කණ නාසයට අදාල ශල්‍යකර්ම සංඛ්‍යාව	543	687	144	20.96
iii. අක්ෂි අංශය				
CCTපරීක්ෂණ සංඛ්‍යාව	16	52	36	69.23
Topographe පරීක්ෂණ සංඛ්‍යාව	59	107	48	44.85
iv. මාතෘ ඒකකය				
Doppler scans පරීක්ෂණ	214	562	348	61.92
Ultrasound scans	2979	4613	1634	35.42
v. Medical check-up -FEB	4086	6659	2573	38.63

(ආ) ඉකුත් වර්ෂයේ ගෙවන වාට්ටුවල ඇඳන් උපයෝජනය 61% ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේදී 51.63% දක්වා පහත වැටී තිබුණි.

(ඇ) අක්ෂි අංශයේ vishual fields පරීක්ෂණය සිදුකරන යන්ත්‍රය ක්‍රියා විරහිතව පැවතීම නිසා සමාලෝචිත වර්ෂයේදී කිසිදු පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ඈ) භෞත චිකිත්සක අංශය මගින් කාර්සාධන තොරතුරු ඉදිරිපත් කර නොතිබුණු බැවින් කාර්යසාධනය පිලිබඳ ඇගයීමට නොහැකි විය.

(ඉ) ස්නායු වෛද්‍ය දැඩි සත්කාර ඒකකය සමාලෝචිත වර්ෂයේදී දින 50 ක් පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණු අතර ඉතිරි දින 315 ම නිෂ්කාර්යව පැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ස්නායු වෛද්‍ය දැඩි සත්කාර ඒකකය 86% ක්ම නිෂ්කාර්යව පැවතුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඖෂධ ප්‍රසම්පාදනයට අදාල මිල ගණන් විවෘත කිරීමෙන් පසු දින 45 සිට දින 88 දක්වා වූ කාල පමාවකින් පසුව ප්‍රසම්පාදන කමිටු රැස් වී තිබුණු අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.

(ආ) රු.2,221,110ක් වටිනා Elastic Adhesive Bandage (10 cmx4.5 cm) රෝල් 4,500 ක් මිලදී ගැනීම සඳහා ගුණත්වයෙන් උසස් යැයි සඳහන් කර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තෙවන අවම මිල ඉදිරිපත් කල ආයතනය තෝරා ගෙන තිබුණද එම වෙළුම් ද්‍රව්‍යවල තත්ත්වය ගුණත්වයෙන් අඩු බවට පසුව අනාවරණය වී තිබුණි.

(ඇ) ස්නායු ශල්‍ය ඒකකය සඳහා වූ උපකරණ අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම රු. 15,750,000

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. රු. 12,437,668 ක් වටිනා උපකරණ පමණක් ඇණවුම් කර තිබුණු අතර තවදුරටත් උපකරණවල අවශ්‍යතාවය තිබියදී 21 % ක් වූ ඉතිරි ප්‍රතිපාදන උපයෝජනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

ii. ස්නායු ශල්‍ය උපකරණ සඳහා මිල ගණන් කැඳවීමෙන් අනතුරුව භාණ්ඩ ඇණවුම් කිරීමට දිගු කාලයක් ගත වීම හේතුවෙන් සැපයුම්කරු නියමිත කාල සීමාව තුලදී භාණ්ඩ සැපයීමට අපොහොසත් වී තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාවේ වැඩි වීමක් නොතිබියදී සමාලෝචිත වර්ෂයේ ඖෂධ පරිභෝජනය රු. 39,846,032 කින් හෙවත් 42% කින් වැඩි වී තිබුණි.

(ආ) රෝගීන්ට ඖෂධ බිල් කිරීමේදී 10% හා 30%ක් වශයෙන් ලාභාන්තියක් එකතු කරන අතර සමාලෝචිත වර්ෂයේ පරිභෝජනය කරන ලද ඖෂධවල ගත් මිල රු. 137,297,459 ක් වූ අතර එයට අවම වශයෙන් 10% ක ලාභාන්තික් පමණක් එකතු කල විට රු. 151,027,205 ක ආදායමක් ලැබිය යුතු විය. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන අනුව ඖෂධ වෙනුවෙන් ලැබූ ආදායම රු. 132,137,313 ක් වූ හෙයින්, රු. 18,889,892 ක ආදායමේ ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ඇ) රෝගීන්ට නිකුත් කරන ලද ඖෂධවල ගත් මිල රු.137,297,459 ක් වන අතර එය විකුණා ලද ආදායම රු 132,137,313 ක් වූයෙන් ඖෂධ අලෙවියෙන් රු.5,160,146 ක අලාභයක් සිදු වී තිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රෝහලේ මූලධන වියදම් සඳහා රු. 346,000,000 ක ප්‍රතිපාදනයක් අනුමත කර තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් රු. 231,000,000 ක් (ඉකුත් වර්ෂයට අදාල රු. මිලියන 20 ක් ද ඇතුළුව) ලැබී තිබුණි. මෙම මුදලින් වර්ෂය තුල රු.109,732,752 ක මුදලක් වැය කර තිබුණෙන් ඉතිරි මුදල වූ රු.121,267,248 ක් ඇස්තමේන්තුගත කාර්යන් සඳහා භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2005 අගෝස්තු මාසයේදී රෝහල විසින් රු. 10,000,000 ක් වටිනා සත්දින නිවේදන තැන්පතුවක් ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය සත්දින නිවේදන තැන්පතු වශයෙන්ම පැවතුණි. මෙම තැන්පතු බොහෝ විට කෙටිකාලීනව මුදල් නැවත ලබා ගැනීමේ අරමුණින් කරනු ලබන ආයෝජනයක් වන අතර මෙම මුදල දිගු කාලීන ආයෝජනයක යෙදවූයේ නම් රෝහලට වාසිදායක පොලියක් ලබා ගැනීමට තිබූ අවස්ථාව මඟ හැරී ගොස් තිබුණි.

4.5 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගබඩා 05 ක රු. 12,230,497 ක් වටිනාකමැති තොග වර්ෂය පුරාම භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2011 අගෝස්තු මාසයේදී නව චිලර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු අතර එය මිලදී ගැනීමෙන් පසු අඛණ්ඩව නව යන්ත්‍රය සේවයේ යොදවා තිබුණු අතර රුපියල් ලක්ෂ 36 කට වැඩි මුදලක් වැය කර අළුත්වැඩියා කරනු ලැබූ පැරණි චිලර් යන්ත්‍ර 2 සේවයේ යොදවා තිබුණේ වසරකටත් අඩු කාලයකි. මේ වන විට අලුත්වැඩියා කරන ලද චිලර් යන්ත්‍ර 2 ඌණ උපයෝජිතව තිබුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාක්ෂණික ඇගයීම් කමිටු තීරණයට අනුව අවම මිල ගණන් යටතේ ඖෂධ මිලදී නොගෙන ඉහල මිල ගණන් යටතේ ඖෂධ මිලදී ගෙන තිබුණු අතර, එම ඖෂධවලින් රෝගීන්ගෙන් අඩු ගාස්තුවක් අය කිරීම නිසා ඖෂධ වර්ග 3 කින් රෝහලට සිදු වූ පාඩුව රු. 4,491,800 ක් විය.

(ආ) චිලර් යන්ත්‍රයේ තක්සේරු වටිනාකම රු.150,000 ක් වුවද සැපයුම්කරුට එය රු.80,000 කට ලබා දීමෙන් රු.70,000 ක අලාභයක් සිදු වී තිබුණි.

4.7 කොන්ත්‍රාත් පාලන දුර්වලතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

කොන්ත්‍රාත්තුවට අදාල විස්තර	මුදල	නිරීක්ෂණ
	රු.	
(අ) (i) Eye Drapes ඒකක 2,200 ක් මිලදී ගැනීම (ශල්‍ය ද්‍රව්‍ය)	869,000	ටෙන්ඩර් කොන්දේසි 6 අනුව ඇණවුම ඉදිරිපත් කල දින සිට දින 14 ක් ඇතුලත ඇණවුම් වටිනාකමින් 10% ක කාර්යසාධන ඇප බැඳුම්කරයක් ඉදිරිපත් කල යුතු වුවද එසේ කර නොතිබුණි.
(ii) Gauze Absorbent (cotton) 36x100 yards (වෙළුම් ද්‍රව්‍ය)	6,837,000	
(ආ) විවිධ ඖෂධ මිලදී ගැණුම්	19,055,924	
(ඇ) නව රථගාල සඳහා ඉලෙක්ට්‍රෝනික පාලන පද්ධතියක් මිලදී ගැනීම සහ නඩත්තු සේවා පවත්වා ගෙන යාම	1,778,734	i. ටෙන්ඩරය පිරිනමන අවස්ථාවේ අදාල සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම. ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.4.8 වගන්තිය ප්‍රකාරව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් 5% කට නොඅඩු කාර්යසාධන ඇප බැඳුම්කරයක් ලබා ගෙන නොතිබීම. iii. ඉදිරිපත් කරන ලද මිල කොන්දේසිවලට අනුව පාලන පද්ධතියේ මෘදුකාංග වටිනාකම වූ රු. 325,000 න් 30% ක් වූ රු. 97,500 ක වාර්ෂික මෘදුකාංග සේවා ගාස්තුව සම්බන්ධයෙන් (පිරිවැයෙන් 1/3 කට ආසන්න අගයක් ගැනීම) අදාල මිලදී ගැනීම සිදුකරන අවස්ථාවේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබීම. iv. සේවා ගිවිසුමට අනුව සෑම මාස 3 කට වරක්ම අදාල සේවාවන් සිදු කල යුතු වුවද සේවා ගිවිසුමට අදාල කාලපරිච්ඡේදයෙන් මාස 06 ක් ගතවීමෙන් පසු සේවා ගිවිසුමට එළඹ තිබීම.

		v. ඉදිරිපත් කරන ලද මිල කොන්දේසිවලට අනුව දෘඩාංග සඳහා වාර්ෂික සේවා ගාස්තුවක් අය කරන බව දක්වා නොතිබියදී දෘඩාංග සඳහාද එම වටිනාකමෙන් 20% ක නඩත්තු ගිවිසුමකට ඇතුලත්ව තිබුණු අතර 2010 වර්ෂයට අදාලව 2010 වර්ෂයේ මාස 06 ක් ඉක්මවීමෙන් පසු ගිවිසුමකට එළඹ තිබීම කාර්තුවකට වරක් සේවා සිදු කෙරෙන බැවින් මේ හේතුවෙන් සේවා වාර දෙකක් සිදු කිරීම ගිලිහී ගොස් තිබීම.
(ඇ) කඩා වැටුණු මායිම් තාප්පයේ කොටසක් ඉදි කිරීම	රු. 241,395	ඉදිරිපත් කරනු ලැබූ ඇස්තමේන්තුව පදනම් කරගෙන ගෙවීම් කර තිබූ අතර ඒ සඳහා වූ කල වැඩ වාර්තාවක් නොවීම.
(ඉ) අපහරණ ද්‍රව්‍ය ගබඩාව ඉදි කිරීම	රු. 982,918	i. අතිරේක වැඩ සඳහා රු. 468,242 ක් ගෙවා තිබූ අතර ඒ සඳහා කල වැඩ වාර්තාවක් හෝ ඉංජිනේරු හෝ කාර්මික නිලධාරි වාර්තාවක් නොවීම. ii. කාර්ය නිම කර මාස 2 ක් ගත වීමෙන් අනතුරුව අතිරේක වැඩ සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දීම.
(ඊ) වායු සමීකරණ පද්ධතියේ චිලර් යන්ත්‍ර දෙකෙහි අළුත්වැඩියාව	රු. 3,692,886	i. ධාවන පැය 24,000 කට පසුව කලයුතු අලුත්වැඩියාවක් ලෙස අළුත්වැඩියා ඇස්තමේන්තුවක් 2008 ඔක්තෝබර් ඉදිරිපත් කර තිබූ නමුත් අලුත්වැඩියා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම 2010 පෙබරවාරි මාසයේදී සිදු කර තිබුණි. ii. අදාල අලුත්වැඩියාව අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවක්ද යන්න පිළිබඳ ලංකා විදුලිබල මණ්ඩලයේ නිර්දේශ ඉල්ලා තිබුණු නමුත් සේවා සපයන ආයතන සමඟ ඒකාබද්ධව ඔවුනගේ නිර්දේශ ලබා දී තිබුණු බැවින් නිර්දේශයන්හි ස්වාධීනත්වය පිළිබඳවද තහවුරු නොවීය.

iii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.9.1. වගන්තිය ප්‍රකාරව රෝහල විසින් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

iv. එම සංග්‍රහයෙහි 5.4.4.(1) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස උපරිම වශයෙන් 20% ක ප්‍රමාණයක් පමණක් ගෙවිය හැකි වුවද, මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු. 3,692,886 ක මුදලම අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

v. එම සංග්‍රහයෙහි 5.4.6.(ඇ) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු සෑම ගෙවීමකින්ම නිශ්චිත මුදලක් රඳවා ගත යුතු වුවද මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

vi. රු. ලක්ෂ 20 ක මුදලක් වැයකර දෝෂ සහිත කන්ඩෙන්සර් කොයිල් 02 ක් සපයා තිබූ අතර පසුව ඒවා එසේම තිබියදී වෙනත් කන්ඩෙන්සර් 02 ක් සවි කර තිබුණි. එම නිසා වැඩි විදුලි වියදමක් දැරීමට සිදු වී තිබුණි.

vii. එසේම අමතර කන්ඩෙන්සර් දෙක ආනයනය කර සවි කිරීමට මාස 2 1/2 කට වැඩි කාලයක් ගත වන බව දක්වා තිබුණද මාසයක් වැනි කාලයක් තුළදී අමතර කන්ඩෙන්සර් සවි කර තිබුණු බැවින් ඒවා සත්‍ය වශයෙන් ආනයනය කරන ලද අලුත් ඒවාද යන්න පිළිබඳ විගණනයට තහවුරුවක් නොවීය.

viii. අලුත්වැඩියා ඇස්තමේන්තු අනුව ඒ සඳහා දින 16 කට ආසන්න කාලයක් ප්‍රමාණවත් බව දක්වා තිබුණද අදාල අලුත්වැඩියාව සඳහා මාස 08 කට වැඩි කාලයක් ගෙන තිබුණි.

		ix. අළුත් වැඩියාව අසාර්ථක බැවින් අත්තිකාරම් බැදුම්කරය මුදල් කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබියදී එය නොසලකා බැදුම්කරය නිදහස් කර තිබුණි.
(ඇ) උසස් කන්තුක මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ වායු සමීකරණ පද්ධතියේ ජල කාන්දුව අළුත්වැඩියාව	791,178	i. රෝහලේ ඉංජිනේරු නිලධාරියා විසින් අළුත්වැඩියා ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර සැපයුම්කාර ආයතනයේ ඇස්තමේන්තු අනුව එම ආයතනයට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි.
		ii. ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුවේ හෝ බිල්පතෙහි අලුත්වැඩියාව සඳහා සපයා සවි කරන ද්‍රව්‍ය සහ ඒ සඳහා අය කරනු ලබන කම්කරු ගාස්තු හා වැඩ කුලී වෙනම දක්වා නොතිබුණි.
		iii. යොදා ගන්නා ලද ද්‍රව්‍යවල වටිනාකම රු. 100,000 කට අඩු වුවද අළුත්වැඩියා වියදම රු. 791,178 ක් වී තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රෝහලේ අනුමත සේවක සංඛ්‍යාව හා තත්‍ය සේවක සංඛ්‍යාව අතර පහත පරිදි ඌනතාවයන් සහ අතිරික්තයන් නිරීක්ෂණය විය.

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඌනතා/ අතිරික්ත
හෙද කාර්ය මණ්ඩලය	528	529	1
ශිෂ්‍ය හෙද මණ්ඩලය	300	102	(198)
ස්ථිර කම්කරුවන්	25	20	(5)
අනියම් කම්කරුවන්	-	11	11
ඖෂධවේදී	20	17	(3)
වෛද්‍ය රසායනාගාර නිලධාරීන්	38	35	(3)

(ආ) බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කර ඇති සුදුසුකම් කිසිවක් සම්පූර්ණ කර නොතිබූ වෛද්‍යවරයෙක් රෝහල් නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවාගෙන තිබුණි.

(ඇ) රෝහල සතු උපකරණ බැහැරට ගෙන යෑම සඳහා සාවද්‍ය ලේඛනයක් පිළියෙල කල ඉංජිනේරුවරයා එම වරද පිලිගෙන තිබූ හෙයින් දඬුවම් සහිතව නැවත සේවයේ පිහිටුවා තිබුණි.

4.9 වාහන උපයෝජනය

කාර් රථයක් 2008- 2009 සහ 2010 යන වර්ෂ 3 හිදීම නිෂ්කාර්යව පැවති නමුත් එම වර්ෂ තුන තුලදී රු.127,667 ක අළුත්වැඩියා වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මෙම කාර් රථය කි.මී. 791 ක් පමණක් ධාවනය කර තිබුණු අතර ඒ සඳහා අළුත්වැඩියා සේවා සහ ඉන්ධන වියදම් ලෙස රු. 152,148 ක මුළු වියදමක් දරා තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේදී මෙම රථයේ කි.මී. 1 ක පිරිවැය රු. 192 ක් වී තිබුණි.

4.9.1 බාහිර පාර්ශව සතු වාහන

රෝහලේ කාර්යයන් සඳහා යොදා ඇති සෞඛ්‍ය අමාත්‍යාංශය සතු කාර් රථයක් සහ ගිලන් රථයක් අමාත්‍යාංශය වෙත භාරදීමට හෝ රෝහල වෙත පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම

2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසාන වීමෙන් දින 60 කට පසුව විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු බව දක්වා තිබුණද, රෝහලේ මූල්‍ය ප්‍රකාශන මාස 02 ක ප්‍රමාදයක් සහිතව 2012 මැයි 04 දිනදී ඉදිරිපත් කර තිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ අදාල කාර්යන් සඳහා වගකිවයුතු පුද්ගලයන් දක්වා නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ස්නායු ශල්‍ය වෛද්‍ය ඒකකය සඳහා උපකරණ මිලදී ගැනීමේ කටයුතු මාසයක කාලයක් තුල අවසන් කල යුතු බව දක්වා තිබුණද ටෙන්ඩර් විවෘත කල දින සිට භාණ්ඩ ලැබීම සම්පූර්ණ කිරීම දක්වා වසරක කාලයක් ගත වී තිබූ බැව් නිරීක්ෂණය විය.

5.3 අභ්‍යන්තර විගණනය

1971 අංක 38 දරන මුදල් පනතේ 13(5)(ඩී) ප්‍රකාරව ඉදිරිපත් කල යුතු අර්ධ වාර්ෂික විගණන වාර්තා වලින් පළමු අර්ධ වර්ෂය වෙනුවෙන් වාර්තාව ඉදිරිපත් කර නොතිබූ අතර දෙවන අර්ධ වාර්ෂික වාර්තාව මාස 04 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

5.4 විගණන හා කළමනාකරණ කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අඩු තරමින් මාස 03 කට වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් 2011 වර්ෂයේදී රැස්වීම් පවත්වා නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අයවැය ලේඛනය සහ තථ්‍ය ආදායම් සහ වියදම් අතර විෂයයන් 15 කට අදාලව 26% සිට 525% දක්වා පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) වර්ෂය අවසානයට ප්‍රාග්ධන ලැබීම්වල ඉතිරිය රු. 121,267,248 ක් වුවත් ඊට අදාල මුදල් පොත අනුව බැංකු ශේෂය රු. 103,658,056 ක් විය. ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු රු.17,609,192 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැය කිරීම එම වෙනසට හේතුවේ.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රෝහල් මණ්ඩලයේ සභාපති වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කල යුතුය.

(අ) ගබඩා පාලනය
(ආ) ශල්‍ය ද්‍රව්‍ය සැපයීම සහ වෙළුම් ද්‍රව්‍ය සැපයීම
(ඇ) ඖෂධ ඇණවුම් කිරීම
(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ඉ) අත්තිකාරම් දීම සහ ලේඛණගත කිරීම
(ඊ) වාහන පරිපාලනය සහ ලිපිගොනු නඩත්තුව
(උ) ගිණුම්කරණය

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

දස අවුරුදු සාරාංශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

රු. "000"	2011	2010	2009	2008	2007	2006	2005	2004	2003	2002
පිරිවැටුම(රෝහල් ගාස්තු)	828,236	812,121	721,761	588,214	521,147	480,290	411,959	395,886	366,516	326,456
රජයේ පුනරාවර්තන ප්‍රදාන	837,000	775,000	775,000	736,400	672,277	588,000	510,000	350,000	266,000	307,700
පොළී ආදායම	4,443	3,334	4,823	4,933	4,995	4,866	5,399	6,916	7,960	14,033
වෙනත් ආදායම්	24,032	32,909	27,099	17,399	14,742	15,483	12,116	9,465	8,470	10,583
මුළු ආදායම	1,693,711	1,623,364	1,528,683	1,346,886	1,213,161	1,088,640	939,474	762,267	730,935	733,468
මුළු වියදම	1,721,606	1,571,299	1,555,528	1,438,597	1,398,270	1,167,885	1,129,901	935,184	857,524	847,019
අතිරික්ත/ (හිඟය)	(27,895)	(52,065)	(26,845)	(91,711)	(78,210)	(79,245)	(190,427)	(172,917)	(126,589)	(113,551)
රජයේ ප්‍රාග්ධන ප්‍රධාන	236,785	115,000	102,925	106,100	130,591	105,000	46,141	145,863	98,614	118,230

වත්කම් (රු. 000)

ජංගම නොවන වත්කම්	804,318	803,638	853,896	807,591	803,619	786,394	792,681,	758,906	738,227	677,396
ජංගම වත්කම්	415,107	326,853	273,371	256,401	250,713	254,052	291,259	316,434	257,147	357,914

ද්‍රවශීලතාවය හා වගකීම් (රු. 00)

ප්‍රාග්ධන හා සංචිත	132,133	358,034	304,385	333,553	416,122	474,087	557,656	725,122	756,692	897,824
ජංගම බැරකම්	787,293	772,459	806,883	730,439	638,210	566,359	526,284	350,237	238,682	137,839

සංඛ්‍යා ලේඛන

ඇඳන් භාවිත සංඛ්‍යාව	1,047	1,046	1,043	1,013	1,011	1,006	1,000	1,012	984	984
ඇතුළත් කළ රෝගීන් සංඛ්‍යාව	52,554	53,962	55,142	53,952	52,203	56,996	53,420	56,803	51,577	58,867
ප්‍රතිකාර ලබා පිටවූ රෝගීන් සංඛ්‍යාව	52,761	53,931	55,319	53,967	52,331	56,380	51,448	56,822	51,618	58,886
දෛනිකව රෝගීන් ඇතුලත් කිරීමේ සාමාන්‍යය	144	148	151	148	143	167	141	155	141	161
දෛනිකව රෝගීන් පිටවීමේ සාමාන්‍ය	145	146	152	148	143	163	141	155	141	153
දෛනිකව අසනීප රෝගීන්ගේ සංඛ්‍යාව	693	670	780	741	704	726	605	630	578	639
රැඳී සිටින කාලයේ සාමාන්‍යය (දින)	4	4	5	5	4	5	5	5	5	5
ඇඳන් භාවිතය (%)	67 %	66 %	75 %	73 %	70 %	72 %	74 %	63 %	59 %	65 %
පවත්වන ලද සායන සංඛ්‍යාව	2,851	2,822	2,782	2,515	2,478	2,170	2,117	2,183	2,202	2,144
මුල්වරට පැමිණීමේ සංඛ්‍යාව	25,722	26,312	26,961	24,825	26,604	27,113	27,066	27,251	27,673	29,447
පසුව පැමිණීමේ සංඛ්‍යාව	121,567	123,611	126,630	123,165	124,810	136,138	133,178	128,133	129,312	135,708
හදිසි ප්‍රතිකාර ඒකකයට පැමිණි වාර ගණන	36,898	38,012	40,452	38,005	34,695	30,026	32,709	38,672	32,664	59,106
බාහිර රෝගීන්ගේ පැමිණීමේ එකතුව	16,433	15,536	16,222	16,895	18,722	17,554	15,827	211,694	206,502	224,216
සායනයකට පැමිණි රෝගීන්ගේ සංඛ්‍යාව	52	53	55	59	62	76	76	76	71	77